# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1993 අංක 14 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 මාර්තු මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 අප්‍රේල් මස 02 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබා ගත හැක.

මිල රු. 3.00 යි. තැපැල් ගාස්තුව: රු. 3.10 යි.

## 1993 අංක 14 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 මාර්තු මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 51/91.

සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1993 අංක 14 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. *(කෙටි නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.)*

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 338 වන වගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— *(101 වන අධිකාරයේ 338 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

"(ආ) "නීත්‍යානුකූල නියෝජිතයා" යන්නෙන්, පොල්මෑකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ රුපියල් පන් ලක්ෂයකට අඩු වටිනාකමක් ඇති බූදලයක් සම්බන්ධයෙන් වූ විට උරුමය භාරගනු ලැබූ ළඟම නෑයා හෝ අදහස් වේ:

එසේ වුව ද, නීත්‍යනුකූල නියෝජිතයා කවරකු ද යන්න පිළිබඳව යම් ආරාවුලක් පැන නැගුණහොත් 397 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ, 394 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "නීත්‍යානුකූල නියෝජිතයා" යන්නෙහි අර්ථකථනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියේ 394 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

"නීත්‍යානුකූල නියෝජිතයා" යන්නෙන්, පොල්මෑකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ රුපියල් පන් ලක්ෂයකට අඩු වටිනාකමක් ඇති බූදලයක් සම්බන්ධයෙන් වූ විට, උරුමය භාර ගනු ලැබූ ළඟම නෑයා හෝ අදහස් වේ.".

4. සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXXVIII වන පරිච්ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන පරිච්ඡේදය ආදේශ කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියේ XXXVIII වන පරිච්ඡේදය අභියෝජනය කිරීම.)*

"XXXVIII වන පරිච්ඡේදය

තෙස්තමේන්තු නඩු

*(මියගිය තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රය තැන්පත් කිරීම.)*

516. යම් තැනැත්තකු ශ්‍රී ලංකාවෙහි අන්තිම කැමති පත්‍රයක් තබා මියගිය අවස්ථාවක එය තබන ලද්දේ යම් තැනැත්තකුගේ ආරක්ෂාවෙහි ද නැතහොත් භාරයෙහි ද ඒ තැනැත්තා විසින් හෝ අන්තිම කැමති පත්‍රකරුගේ මරණයෙන් පසු ඒ අන්තිම කැමති පත්‍රය සොයා ගත් තැනැත්තා විසින්, අන්තිම කැමති පත්‍රය සොයා ගැනීමෙන් පසු මාස තුනක් ඇතුළත, අවස්ථාවෝචිත පරිදි, අන්තිම කැමති පත්‍රකරු මියගිය හෝ අන්තිම කැමති පත්‍රය සොයා ගත් තැනැත්තා පදිංචිව

සිටින දිස්ත්‍රික්කයේ දිසා අධිකරණය වෙත හෝ එය ඉදිරිපත් කළ යුතු ය. තවද මරණය සිදු වූ වේලාව සහ ස්ථානය නිවැරදිව සඳහන් කරමින් හා අන්තිම කැමති පත්‍රකරු ඒ අධිකරණයෙහි හෝ වෙනත් යම් අධිකරණයක අධිකරණ බලසීමාව තුළ දේපළ තබා (එය එසේ නම්) මියගිය බව ද වෙනත් අධිකරණයක නම් ඒ කවර අධිකරණයක යන්න ද, ඒ දේපළෙහි ස්වභාවය හා වටිනාකම ද, නැතහොත් අන්තිම කැමති පත්‍රකරු ශ්‍රී ලංකාවෙහි දේපළ නොතබා මියගිය බවට කරුණු වේ නම් ඒ බව ද ප්‍රකාශ කරමින් ඒ තැනැත්තා විසින් දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් කිරීම හෝ (පළමුවන උපලේඛනයෙහි අංක 81 දරන ආකෘතියේ) දිවුරුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම හෝ කළ යුතු ය.

එසේ ඉදිරිපත් කරන ලද අන්තිම කැමති පත්‍රය ප්‍රොබේට් නිලධරයා විසින් අංක කොට තම කෙටි අත්සන යොදා දිසා අධිකරණයේ ලේඛනාගාරයෙහි තැන්පත් කොට තැබිය යුතු ය.

ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලය සඳහා ඉල්ලුම් කිරීම.

517. (1) අන්තිම කැමති පත්‍රය යටතේ හෝ අන්තිම කැමති පත්‍රයක් ප්‍රකාර ශ්‍රී ලංකාව තුළ යම් දේපළක් කෙරෙහි කවර අන්දමකින් හෝ බල පාන යම් අන්තිම කැමති පත්‍රයක් තබා යම් තැනැත්තකු මියගිය අවස්ථාවක, එහි පොල්මෑකරු වශයෙන් පත්කර ඇති යම් තැනැත්තකු විසින්, ඔහු පදිංචිව සිටින දිස්ත්‍රික්කයේ හෝ අන්තිම කැමති පත්‍රකරු මිය යන විට පදිංචිව සිටියේ යම් දිස්ත්‍රික්කයක් තුළ ද ඒ දිස්ත්‍රික්කයේ හෝ අන්තිම කැමති පත්‍රකරුගේ බුද්ධලයට අයත් යම් ඉඩමක් පිහිටියේ යම් දිස්ත්‍රික්කයක් තුළ ද ඒ දිස්ත්‍රික්කයේ හෝ දිසා අධිකරණය වෙත, එකී අන්තිම කැමති පත්‍රය ඔප්පු කරවා ගැනීම සඳහා සහ ඒ පිළිබඳව ප්‍රොබේට් බලපත්‍රය තමා වෙත ප්‍රදානය කරවා ගැනීම සඳහා 524 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත ද ඒ ආකාරයට ද ඉල්ලුම් කළ හැකි ය; අන්තිම කැමති පත්‍රකරුගේ දේපළ අද්මිනිස්ත්‍රාසි කරවා ගැනීම පිළිබඳව අන්තිම කැමති පත්‍රය හෝ අන්‍යාකාරයකින් හෝ සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකු විසින් අන්තිම කැමති පත්‍රය ඔප්පු කරවා ගැනීම සඳහා අන්තිම කැමති පත්‍රයේ පිටපතක් අමුණා ඒ දේපළ පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය තමාට ලබා ගැනීම සඳහා ඒ අධිකරණය වෙත ඉල්ලුම් කළ හැකි ය.

(2) අද්මිනිස්ත්‍රාසි බලය ලැබීමට හිමිකම් ඇති යම් තැනැත්තෙක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටී නම් ඒ තැනැත්තාගේ යථා පරිදි පත් කරනු ලැබූ ඇටෝර්නි බලකරුට අවස්ථාවෝචිතව අවශ්‍ය පරිදි අන්තිම කැමති පත්‍රය අමුණා හෝ නොඅමුණා අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ප්‍රදානයක් කරනු ලැබිය හැකි ය.

අන්තිම කැමති පත්‍රයක් ඇති අවස්ථාවක ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය අනිවාර්ය බව.

518. (1) මේ පරිච්ඡේදය ක්‍රියාත්මක වීමෙන් පසුව අන්තිම කැමති පත්‍රයක් අධිකරණයෙහි තැන්පත් කර ඇත්තා වූ ද අන්තිම කැමති පත්‍රය ඔප්පු කරවා ගැනීම සහ ඒ පිළිබඳ ප්‍රොබේට් බල පත්‍රය ප්‍රදානය කරවා ගැනීම සඳහා යම් තැනැත්තකු විසින් ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර නොමැත්තා වූ ද අවස්ථාවක, ඉහතින්ම වූ වගන්තියෙහි විධිවිධාන අනුව ඒ සඳහා ඉල්ලුම් කිරීමට නිසි බලය ඇති යම් තැනැත්තකුට හෝ අධිකරණයේ මතය අනුව, ලේ නෑකම, සම්බන්ධතාවෙහි ප්‍රමාණය, බූදලයේ ආරක්ෂාව හා එය නිසි ලෙස අද්මිනිස්ත්‍රාසි කරනු ලැබීමට ඇති සම්භාවිතාව හේතු කොටගෙන අද්මිනිස්ත්‍රාසිකරුවකු වශයෙන් පත් කිරීමට නිසි වෙනත් යම් තැනැත්තකු වෙත ඒ සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට අවස්ථාවෝචිතව, ඒ අන්තිම කැමති පත්‍රයේ නම් කර ඇති පොල්මෑකරු හෝ පොල්මෑකරුවන් වෙත ප්‍රොබේට් බලපත්‍රය හෝ අන්තිම කැමති පත්‍රය ඇමුණූ හෝ නොඇමුණූ අද්මිනිස්ත්‍රාසි බල පත්‍රය හෝ මේ පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි වූ කාර්ය පටිපාටියට අනුකූලව, අධිකරණය විසින් ප්‍රදානය කළ යුතු ය. තවද එවැනි සෑම අවස්ථාවක ම අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය මෙහි මින්මතු විධිවිධාන සලස්වනු ලබන අන්දමට සීමා කිරීම හෝ නොකිරීම හෝ අධිකරණය සුදුසු යැයි කල්පනා කරන පරිදි කරනු ලැබිය හැකි ය.

මහා භාරකාරවරයා පත් කළ හැකි අවස්ථාව.

519. ඉහතින්ම වූ වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති අන්දමට අද්මිනිස්ත්‍රාසිකරුවකු වශයෙන් පත් කිරීමට අධිකරණයේ මතය අනුව සුදුසු හා නිසි තැනැත්තකු නොමැති අවස්ථාවක, හෝ එසේ පත් කරනු ලැබීමට එවැනි කිසිම තැනැත්තකු කැමති නොවන අවස්ථාවක, මහා භාරකාරවරයා ඒ අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් අධිකරණය විසින් පත් කළ යුතුය ; එහෙත් අන් කිසිදු අවස්ථාවක එසේ පත් නොකළ යුතු ය.

ඇපය.

520. ඉහත කී පොල්මෑකරු ප්‍රොබේට් බලපත්‍රය සඳහා ඉල්ලුම් නොකිරීමේ හේතුව නිසා හෝ ක්‍රියා කිරීමට සුදුසු හා කැමති කිසිදු පොල්මෑකරුවකු ශ්‍රී

ලංකාවෙහි පදිංචිව නොසිටීමේ හේතුව නිසා හෝ 517 වන වගන්තිය යටතේ ඉල්ලුම් කිරීමට සුදුසු කිසිදු තැනැත්තකු අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය සඳහා ඉල්ලුම නොකිරීමේ හේතුව නිසා හෝ 518 වන වගන්තියේ සඳහන් යම් තැනැත්තකු අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් පත් කිරීමට අවශ්‍ය බව පෙනී යන සෑම අවස්ථාවකම දී ම යථා පරිදි බූදලය අද්මිනිස්ත්‍රාසි කිරීම සඳහා අධිකරණය විසින් ඒ තැනැත්තාගෙන් ඇප ගත යුතු අතර, මේ කාර්යය සඳහා මියගිය තැනැත්තාගේ බූදලයේ නියි අද්මිනිස්ත්‍රාසිකරණය සඳහා සෑහෙන සහ ප්‍රමාණවත් ඇපකරුවන් දෙදෙනකු සමඟ, පළමුවන උපලේඛනයේ අංක 90 දරන ආකෘතියෙහි බැඳුම්කරයකට ඇතුළත්වීමට අධිකරණය විසින් ඒ තැනැත්තාට නියම කළ යුතු ය. තවද කිසිදු අවස්ථාවක ඒ ඇප ගැනීම අත්හැරීමට අධිකරණයට බලය නොමැත්තේ ය.

මහාභාරකාරවරයා විසින් අද්මිනිස්ත්‍රාසි කිරීම සඳහා ඉල්ලුම් කිරීම.

521. (1) මහා භාරකාරවරයා අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන කවර හෝ විටක දී, එම බලපත්‍රය ප්‍රදානය සඳහා ඉදිරිපත් කරනු ලබන පෙත්සමෙහි—

(අ) පෙත්සම්කරුගේ උපරිම දැනීම හා විශ්වාසය අනුව, මියගිය තැනැත්තාගේ මරණය සිදු වූ වේලාව සහ ස්ථානය;

(ආ) මියගිය තැනැත්තාගේ උරුමක්කාරයන්ගේ නම් සහ ලිපින දන්නේ නම් එම නම් සහ ලිපින;

(ඇ) තමාට නිසැකව දැනගත හැකි වූ තාක් දුරට මිය ගිය තැනැත්තා මිය යන විට ඉතිරි කොට තිබූ දේපළ පිළිබඳ සම්පූර්ණ සහ සත්‍ය විස්තර;

(ඈ) බූදලය පිළිබඳ බැරකම් දන්නේ නම්, එම විස්තර

සඳහන් කිරීම ප්‍රමාණවත් වන්නේ ය.

(2) අධිකරණය අන්‍යාකාරයෙන් විධාන කළ හොත් මිස, මියගිය තැනැත්තාගේ දේපළ පිළිබඳ ගණන් හිලවු ඉදිරිපත් කිරීමට මහාභාරකාරවරයාට නියම නොකළ යුතු ය.

බූදල් අද්මිනිස්ත්‍රාසි කිරීම සම්බන්ධයෙන් මහා භාරකාරවරයා ඇතු කාර්ය.

522. මහාභාරකාරවරයා අන්තිම කැමති පත්‍රයක් පිළිබඳ ප්‍රොබේට් බලපත්‍රය හෝ මියගිය තැනැත්තකුගේ බූදලය පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ප්‍රදානය හෝ ලබා ඇති කවර හෝ විටක ඔහු විසින් හැකිතාක් දුරට, බූදල් අද්මිනිස්ත්‍රාසි කිරීමට අදාළ මේ පරිච්ඡේදයේ විධිවිධාන අනුව ක්‍රියා කළ යුතු ය :

එසේ වුවද මහා භාරකාරවරයාට—

(අ) පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසි කරු වශයෙන් යම් දිවුරුමක් දීමට නියම නොකළ යුතුය.

(ආ) යම් බැඳුම්කරයක් හෝ ඇපයක් සපයන ලෙස නියම නොකළ යුතු ය. එහෙත් ඒ බැඳුම්කරය හෝ ඇපය සපයන ලද්දාක් මෙන් ඒ බැඳීමට හා අය කිරීම් වලට ම ඔහු යටත් වන්නේ ය.

(ඇ) යම් ලේඛනයක් පිළියෙල කිරීමේ දී හෝ ඒ අවස්ථාවේ දී ඒ ලේඛන යට මුද්දර ඇලවීමට නියම නොකළ යුතු ය. එහෙත් 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතින් නියමිත පරිදි ඔහු විසින් අවසානයේ දී ඒ ගෙවීම් කළ යුතු ය.

(ඈ) අධිකරණය අන්‍යාකාරයකින් විධාන කරනහොත් මිස, අවසාන ගිණුම් ඉදිරිපත් කරන ලෙස නියම නො කළ යුතු ය.

අවස්ථා දෙකින් කවර අවස්ථාවක දී [illegible]යක් කළ යුත්තේ [illegible]වුරුත් [illegible]වද යන වග.

523. අන්තිම කැමති පත්‍රය ඔප්පු කරවා ගැනීම හා ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලය ප්‍රදානය කරවා ගැනීම සඳහා කරනු ලබන හිමි කම් පෑම් අතර ගැටීමක් ඇති වූ අවස්ථාවක දී අන් සියළු තැනැත්තන්ගේ හිමිකම් පෑම්වලට ඉහ ළින් පොල්මෑකරුවකුගේ හෝ ඔහුගේ ඇටෝර්නි බලකරුගේ හිමිකම් පෑම් කෙරෙහි සැලකිල්ල ලැබිය යුතු අතර, ණය හිමියකුගේ හිමි කම් පෑම, අන්තිම කැමති පත්‍රය යටතේ වූ ශේෂ තෙස්තමේන්තු දායාද ලාභියකුගේ හෝ රික්ථ වරණ ලාභියකුගේ හෝ හිමිකම් පෑමට පසුව ගැනීමට කල් තැබිය යුතු ය. අන්තිම කැමති පත්‍ර යක් නොමැති විටක අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රද නය කරවා ගැනීම සඳහා කරන හිමිකම්පෑම් අතර එසේම වූ ගැටීමක් ඇති අවස්ථාවක දී වැන් දඹුවගේ හෝ වැන්දඹු පුරුෂයාගේ හිමිකම් පෑම් කෙරෙහි අන් සියලු හිමිකම් පෑම්වලට ඉහළින් ද උරුමක්කාරයකුගේ හිමිකම් පෑම් කෙරෙහි ණය හිමියකුගේ හිමිකම් පෑමට ඉහළින් ද සැලකිල්ල ලැබිය යුතු ය:

එසේ වුව ද, සෑහෙන හේතු මත අධිකරණය විසින් වැන්දඹුවගේ හෝ වැන්දඹු පුරුෂයාගේ හිමිකම් පෑමකට ඉහළින් වෙනත් හිමිකම් පෑම් කට සැලකිල්ල දක්වනු ලැබිය හැකි ය.

3—ඩී 023031 (92/07)

ප්‍රොබේට් බලපත්‍රය සහ අන්තිම කැමති පත්‍රය ඔප්පු කරවා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමේ ක්‍රමය.

524. (1) මියගිය තැනැත්තකුගේ අන්තිම කැමති පත්‍රය ඔප්පු කරවා ගැනීම සඳහා වූ සෑම ඉල්ලීමක්ම, අන්තිම කැමති පත්‍රය සොයාගත් දින සිට මාස තුනක කාලයක් ඇතුළත පෙත්සමක් හා දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ පෙත්සමෙහි පහත දැක්වෙන දේ අංක යොදන ලද ඡේද මගින් දක්වනු ලැබිය යුතු ය:—

(අ) අන්තිම කැමති පත්‍රයක් ලියා තිබූ බව;

(ආ) මියගිය තැනැත්තාගේ දේපළ පිළිබඳ විස්තර හා ඒවායේ පිහිටීම;

(ඇ) අන්තිම කැමති පත්‍රය ඔප්පු කරවා ගැනීමට පෙත්සම්කරුට හිමිකම් ඇත්තේ යම් හේතු මතද, ඒ හේතු; සහ

(ඈ) පෙත්සම්කරු හිමිකම් පාන්නේ ණය හිමියකු, පොල්මෑකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු, ශේෂ තෙස්තමේන්තු දායාද ලාභියකු, උරුමක්කාරයකු හෝ රික්ථ වරණ ලාභියකු වශයෙන් ද වූ කවර තත්ත්වයකින්ද යන වග.

(2) ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන්නේ යම් දිසා අධිකරණයක් වෙත ද ඒ දිසා අධිකරණය වෙත අන්තිම කැමති පත්‍රය එතෙක් තැන්පත් කර නොමැත්තේ නම්, එය පෙත්සමට ඇමිණිය යුතු ය; එසේ නැතහොත් ඉල්ලීම ඉදිරිපත් කරන අවස්ථාවේ එය අධිකරණයට ගෙනැවිත්, අන්තිම කැමති පත්‍රය ප්‍රදර්ශිතයක් වශයෙන් ඇතිව, දිවුරුම් පත්‍රයකින්, හෝ වාචික සාක්ෂියකින් එහි අනන්‍යතාව දැක්විය යුතු ය.

(3) වෙනත් දිසා අධිකරණයක තැන්පත් කරන ලද, මියගිය තැනැත්තකුගේ අන්තිම කැමති පත්‍රයක් ඔප්පු කරවා ගැනීම සඳහා මේ වගන්තිය යටතේ දිසා අධිකරණයක් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් කිරීමට අදහස් කරන සෑම තැනැත්තකුට ම, ඒ ඉල්ලීමෙහි කාර්යය සඳහා, ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන අධිකරණය වෙත එකී අන්තිම කැමති පත්‍රය මුලින් සඳහන් කළ අධිකරණයෙන් ගෙන්වා ගැනීමට හිමිකම් ඇත්තේ ය. තව ද අන්තිම කැමති පත්‍රය නීත්‍යනුකූලව ලියා අත්සන් කරන ලද බව ඔප්පු කරන්නා වූ ද පෙත්සම්කරුගේ හිමිකම් පෑම අනුව ඔහුගේ තත්ත්වය තහවුරු

කරන්නා වූ ද, ප්‍රදර්ශිතයක් වශයෙන් අන්තිම කැමති පත්‍රය ද සමග විය යුතු සිද්ධි පිළිබඳ දිවුරුම් පත්‍ර වශයෙන් වූ හෝ වාචික සාක්ෂි වශයෙන් වූ ද, ප්‍රමාණවත් සාක්ෂිවලින් ඉල්ලීම සනාථ කළ යුතු ය.

(4) පෙත්සම්කරු විසින් පෙත්සම සමග,—

(අ) 529 වන වගන්තිය යටතේ වූ දැන්වීම පළ කිරීමේ වියදම් පියවීම සඳහා ගාස්තු ගෙවූ බව ඔප්පු කෙරෙන ලියවිලි;

(ආ) පෙත්සම්කරුගේ ඉල්ලීමට එකඟ වන වගඋත්තරකරුවන්ගේ ලියවිල්ලකින් වූ කැමැත්ත

ඉදිරිපත් කළ යුතු ය.

(5) තම ඉල්ලීමට යම් තැනැත්තකු විරුද්ධ වනු ඇතැයි අනුමාන කිරීමට පෙත්සම්කරුට හේතුවක් නොමැති නම්, තම පෙත්සම සමග ඒ බවට දිවුරුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු අතර, වගඋත්තරකරු වන් වශයෙන් යම් තැනැත්තකු තම පෙත්සමෙහි නම් කිරීම නොකර හැරිය හැකි ය.

වටිනාකමින් රුපියල් පත් ලක්ෂයකට වැඩි දේපලක් තබා යම් තැනැත්තකු මියගිය අවස්ථාවක වාර්තා කිරීමේ කාර්යය.

525. යම් තැනැත්තකු අන්තිම කැමති පත්‍රයක් නොතබා ශ්‍රී ලංකාවේ මියගිය අවස්ථාවක, ඒ තැනැත්තාට අයත් වටිනාකමින් රුපියල් පත් ලක්ෂයක් හෝ ඊට වැඩිවන දේපළක් ශ්‍රී ලංකාවෙහි තබා ඇත් නම්, ඔහුගේ මරණය සිදු වූ දින සිට එක් මාසයක් ඇතුළත ඔහු මියගිය දිස්ත්‍රික්කයේ දිසා අධිකරණය වෙත ඒ මරණය වාර්තා කිරීම ද, ඒ සමගම අන්තිම කැමති පත්‍රයක් නොතබා මියගිය ඒ තැනැත්තා දේපළ තබා මිය ගියේ නම්, ඔහු ඒ අධිකරණයෙහි හෝ වෙනත් යම් අධිකරණයක බලසීමාව තුළ දේපළ තබා මිය ගිය බවද, වෙනත් අධිකරණයක අධිකරණ බලසීමාව තුළ, දේපළ තබා මියගියේ නම් ඒ අධිකරණය කවර අධිකරණයක් ද යන්න ද ඒ දේපළවල ස්වභාවය සහ වටිනාකම ද සන්‍යෙක්ෂණය කරමින් දිවුරුමක් දීම හෝ ප්‍රතිඥාවක් කිරීම හෝ දිවුරුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම ඒ තැනැත්තාගේ වැන්දඹුවගේ හෝ වැන්දඹු පුරුෂයාගේ හෝ ළඟම නෑයාගේ හෝ කාර්යය වන්නේ ය.

අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර සඳහා ඉල්ලුම් කළ හැක්කේ කවුරුන් විසින් ද යන වග.

526. යම් තැනැත්තකු අන්තිම කැමති පත්‍රයක් නොතබා මියගිය විට හෝ අන්තිම කැමති පත්‍රය සොයාගත නොහැකි වූ විට සහ එම තැනැත්තා විසින් ශ්‍රී ලංකාව තුළ දේපළ තබා මිය ගොස් ඇත්තා වූ ද අවස්ථාවක—

(අ) මියගිය තැනැත්තාගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කරවීමෙහි ලා සම්බන්ධතාවක් දක්වන කවර හෝ තැනැත්තකු විසින් තමන් වෙත අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කර ගැනීම සඳහා ඉල්ලුම් කළ හැකි ය; එසේ නැතහොත්

(ආ) මියගිය තැනැත්තාගේ බූදලයට අනුප්‍රාප්ත වීමට හිමිකම් ඇති එක් එක් උරුමක්කාරයා, උරුමක්කාරත්වය පිළිබඳ සහතික නිකුත් කරවා ගැනීම සඳහා, එම මියගිය තැනැත්තාගේ යම් උරුමක්කාරයකු විසින් ඉල්ලුම් කළ හැකි ය.

එම ඉල්ලීම, ඉල්ලුම්කරු පදිංචිව සිටින දිස්ත්‍රික්කයේ හෝ මිය ගිය තැනැත්තාගේ මරණය සිදු වූ වේලාවේ දී ඔහු පදිංචිව සිටි දිස්ත්‍රික්කයේ හෝ මිය ගිය තැනැත්තාගේ බූදලයට අයත් යම් දේපළක් පිහිටි දිස්ත්‍රික්කයේ හෝ දිසා අධිකරණය වෙත 528 වන වගන්තියට අනුකූලව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

බූදලය වටිනාකමින් රුපියල් පන් ලක්ෂයකට වැඩි වන අවස්ථාවක අද්මිනිස්ත්‍රාසි කිරීම අනිවාර්ය බව.

527. අවස්ථාවෝචිත පරිදි කිසිම තැනැත්තකු විසින් අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය හෝ උරුමක්කාර භාවය පිළිබඳ සහතිකයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් නොකළා වූ ද, බූදලය හෝ එහි යම් කොටසක් අද්මිනිස්ත්‍රාසි කිරීම සඳහා යම් තැනැත්තකු පත් කිරීම අවශ්‍ය වේ යයි හෝ පහසුවක් වේ යයි අධිකරණයට පෙනී යන්නා වූ ද අවස්ථාවක, බූදලය හෝ එහි යම් කොටසක් අද්මිනිස්ත්‍රාසි කිරීම සඳහා අධිකරණයේ අභිමතය පරිදි යම් තැනැත්තකු, ඒ තැනැත්තා සාමාන්‍ය අවස්ථාගත කරුණු යටතේ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ලබාගැනීමට හිමිකම් ලැබුව ද නැතහොත් අන්‍යාකාරයකින් බූදලය අද්මිනිස්ත්‍රාසි කිරීමට හිමිකම ලැබුව ද ඒ සෑම අවස්ථාවකදී ම මේ පරිච්ඡේදයේ දක්වා ඇති කාර්ය පටිපාටියට අනුකූලව පත් කිරීම නීත්‍යානුකූල විය යුතු අතර, එම බූදලයේ වටිනාකම රුපියල් පන් ලක්ෂයක් හෝ ඊට වැඩි ගණනක් වන අවස්ථාවක අධිකරණය විසින් එවැනි තැනැත්තකු පත් කළ යුතු ය. මේ ආකාරයෙන් කරන ලද යම් පත් කිරීමකට 518 සිට 521 දක්වා, ඒ වගන්ති දෙකද ඇතුළුව වූ වගන්තිවල විධිවිධාන ඒවා අදාළ කරගත හැකිතාක් දුරට අදාළ විය යුතු ය.

අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර හෝ උරුමක්කාර භාවය පිළිබඳ සහතික සඳහා ඉල්ලුම් කිරීමේ ක්‍රමය.

528. (1) අද්මිනිස්ත්‍රාසි හෝ උරුමක්කාර භාවය පිළිබඳ සහතික ප්‍රදානය කිරීම සඳහා දිසා අධිකරණයට කරනු ලබන සෑම ඉල්ලීමක් ම මරණය සිදු වූ දින සිට මාස තුනක් ඇතුළත ඉදිරිපත් කළ යුතු අතර, එය පෙත්සමක් සහ දිවුරුම් පත්‍රයක් මගින් ඉදිරිපත් කළ යුතු ය. එම පෙත්සමේ අංක කරන

ලද ඡේද මගින් පහත දැක්වෙන දේ දක්වා තිබිය යුතු ය:—

(අ) අන්තිම කැමති පත්‍රයක් නොමැති බව;

(ආ) මියගිය තැනැත්තාගේ මරණය සිදු වූ බව;

(ඇ) පෙත්සම්කරුගේ උපරිම දැනීම අනුව මිය ගිය තැනැත්තාගේ උරුමක්කාරයන්;

(ඈ) මියගිය තැනැත්තාගේ දේපළ පිළිබඳ විස්තර සහ එහි පිහිටීම;

(ඉ) බුදලයේ බැරකම් පිළිබඳ විස්තර;

(ඊ) බුදලයේ ණය හිමියන් පිළිබඳ විස්තර;

(උ) පෙත්සම්කරු හිමිකම් පාන්නේ කවර තත්වයකින් ද යන බව සහ එසේ ඔහු විසින් හිමිකම්පෑම යුක්තිසහගත බව ඔප්පු කරන සිද්ධීන්;

(ඌ) උරුමක්කාරයන් එකඟ වී ඇත්නම්, එක් එක් උරුමක්කාරයාට ලබා ගැනීමට හිමිකම් ලබන බුදලයේ පංගුව.

(2) පෙත්සමේ සඳහන් වැදගත් කරුණු මුල් බැල්මට පිළිගත හැකි සේ ඔප්පු කර වන ප්‍රමාණවත් සාක්ෂි මගින් ඉල්ලීම සනාථ කරනු ලැබිය යුතු අතර, මියගිය තැනැත්තාගේ ළඟම නෑයින් වගඋත්තරකරුවන් වශයෙන් එහි නම් කරනු ලැබ තිබිය යුතු ය. පෙත්සම්කරුගේ ඉල්ලීමට යම් තැනැත්තකු විරුද්ධ වෙතැයි අනුමාන කිරීමට පෙත්සම්කරුට හේතු නොමැති නම්, ඒ බවට වූ දිවුරුම් පත්‍රයක් පෙත්සම්කරු විසින් පෙත්සම සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(3) පෙත්සම්කරු විසින් පෙත්සම සමඟ—

(අ) 529 වන වගන්තිය යටතේ වූ දැන්වීම පළ කිරීමේ වියදම පියවීම් සඳහා ගාස්තු ගෙවූ බව ඔප්පු කෙරෙන ලියවිලි;

(ආ) පෙත්සම්කරුගේ ඉල්ලීමට එකඟ වන වගඋත්තරකරුවන්ගේ ලිය විල්ලකින් වූ කැමැත්ත.

(ඇ)

ඉදිරිපත් කළ යුතු ය.

524 වන සහ 528 වන වගන්ති යටතේ ඉල්ලීමට අදාළ දැන්වීම පළකිරීම.

529. (1) 524 වන හෝ 528 වන වගන්තිය යටතේ දිසා අධිකරණය වෙත කරනු ලබන සෑම ඉල්ලීමක් ම දිසා අධිකරණයේ ප්‍රොබේට් නිලධරයා විසින් භාර ගත යුතු අතර, ප්‍රොබේට් නිලධරයා විසින් ඒ කාර්යය සඳහා පවත්වා ගෙන යනු ලැබිය යුතු වෙනම ලේඛනයක එය ලියාපදිංචි කළ යුතු ය. ඊට පසුව ඔහු විසින් (2) වන උපවගන්තිය අනුව නියමිත පළ කිරීම් කරවීමට සැලැස්විය යුතු ය.

(2) දිසා අධිකරණයක ප්‍රොබේට් නිලධරයා විසින් සෑම මාසයකම තුන්වන ඉරුදිනයෙන් ආරම්භ වන සතියේ යම් දිනයක පළමුවන උප ලේඛනයෙහි අංක 84 වන ආකෘතියෙහි වූ දැන්වීමක් මගින් පහත දැක්වෙන කරුණුවලට අදාළව ~~තොරතුරු ඇතුළත් කරමින්~~ නියමිත දේශීය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රයක පළ කර විය යුතු ය:—

(i) පූර්වයෙන් වූ මාසයේ දී දිසා අධිකරණයට 524 වන හෝ 528 වන වගන්තිය යටතේ ලැබුණු සෑම ඉල්ලුම් පත්‍රයක් ; සහ

(ii) එම දිසා අධිකරණයට 524 වන හෝ 528 වන වගන්තිය යටතේ ලැබුණා වූ ද, එම දිසා අධිකරණය සම්බන්ධයෙන් කලින් මාසයේ පළ කරන ලද දැන්වීමේ ප්‍රථම වරට ඇතුළත් කරනු ලැබුවා වූ ද, සෑම ඉල්ලුම්පත්‍රයක් ;

කෙසේ වුවද 524 හෝ 528 වන වගන්තිය යටතේ සෑම දිසා අධිකරණයකටම ලැබුණු සෑම ඉල්ලුම් පත්‍රයක්ම සම්බන්ධයෙන් තොරතුරු අනුගාමී මාස දෙකක් තුළ වෙන් වෙන් අවස්ථා දෙකක දී පළ කරනු ලැබ තිබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ පළ කරනු ලබන දැන්වීමෙන් යම් අන්තිම කැමති පත්‍රයක් ඔප්පු කළ බව ප්‍රකාශ කෙරෙන ආඥාවක් කිරීමට හෝ දැන්වීම අදාළ වන යම් තැනැත්තකුට අන්තිම කැමති පත්‍රය අමුණා හෝ එසේ නොමැතිව ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ උරුමක්කාර භාවය පිළිබඳ සහතික නිකුත් කිරීම සම්බන්ධයෙන් විරෝධතා ඇති තැනැත්තන්ට තමන්ගේ එම විරෝධතා ලිඛිතව ද, දිවුරුම් පත්‍රයක් මගින් සනාථ කරනු ලැබ ද, දැන්වීමේ නිශ්චිතව සඳහන් වූ ද (2) වන උපවගන්තියේ සඳහන් පළමු වන පළ කිරීමේ දින සිට දින හැටකට වඩා කලින් නොවූ ද, දින හැට හතකට වඩා පසු නොවූ ද දිනයක ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබිය යුතු ය.

(4) විරෝධතා තිබීමක් ඇත්නම් එම විරෝධතා ඉදිරිපත් කරන තැනැත්තා, එම විරෝධතාවල පිටපත්, අවස්ථෝචිත පරිදි 524 වන හෝ 528 වන වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන තැනැත්තාට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම විරෝධතාවල නම් කරනු ලැබ ඇති අනෙකුත් පාර්ශ්වකරුවන්ට ද භාර දෙනු ලැබිය යුතු ය.

භාරකරුවකු හෝ කළමනාකරුවකු පත් කිරීම.

530. ~~එම දැන්වීමේ නම් කර ඇති~~ උරුමක්කාරයන්, තෙස්තමේන්තු දායාදලාභීන් හෝ අර්ථලාභීන් අතුරින් යමකු ස්වාභාවික භාරකරුවකු නොමැති බාලවයස්කරුවකු හෝ, භාරකරුවකු නොමැති සිහි විකල වූ තැනැත්තකු වේ නම් දිසා විනිශ්චයකාරවරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ විට, භාරකරුවකු හෝ කළමනාකරුවකු පත් කිරීමට පියවර ගත යුතු ය. එම ඉල්ලුම්පත්‍රය සම්බන්ධයෙන් දිසා විනිශ්චයකාරවරයා ස්වකීය නිල කාමරයේදී කටයුතු කළ යුතු ය.

524 වන සහ 528 වන වගන්ති යටතේ කරන ලද ඉල්ලීමක් මත ආඥාව.

531. (1) 529 වන වගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමකට ප්‍රතිචාරයක් වශයෙන් 524 වන හෝ 528 වන වගන්තිය යටතේ වූ යම් ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් විරෝධතාවක් එම දැන්වීමෙහි, එම ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් නිශ්චිතව සඳහන් දින හෝ ඊට පෙර ලැබී නොමැති නම්, අධිකරණය විසින්—

(අ) 524 වන වගන්තිය යටතේ වූ ඉල්ලුම්පත්‍රයක් සම්බන්ධයෙන් වූ විට, ඉදිරිපත් කර ඇති සාක්ෂි අන්තිම කැමති පත්‍රය නිසි ලෙස සාදා ඇති බවට සහ පෙත්සම්කරුගේ තත්ත්වය පිළිබඳව බැලූ බැල්මට ඔප්පු වීමට තරම් ප්‍රමාණවත් වන බවට අධිකරණය සෑහීමට පත්වුවහොත්, අන්තිම කැමති පත්‍රය ඔප්පු කරනු ලැබූ බවට අධිකරණය විසින් ආඥාවක් කළ යුතු අතර—

(i) ඉල්ලුම්කරු අන්තිම කැමති පත්‍රයේ පොල්මෑකරු හෝ පොල්මෑකරුවන්ගෙන් කෙනකු වශයෙන් හිමිකම් පාමින්, එහි ප්‍රොබේට් බල පත්‍රය තමාට ප්‍රදානය කරන ලෙස ඉල්ලා සිටින්නේ නම්, ආඥාව මගින් ඔහු පොල්මෑකරු බව ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර, ඒ අනුව මෙහි මින්මතු නියම කරනු ලබන කොන්දේසිවලට අනුකූලව ඔහුට ප්‍රොබේට් බල පත්‍රය ප්‍රදානය කිරීමට විධාන කළ යුතු ය ; නැතහොත්

(ii) ඉල්ලුම්කරු පොල්මෑකරු වශයෙන් නොව වෙනත් තත්ත්වයකින් පෙනී සිටිමින්, මියගිය තැනැත්තාගේ දේපළ පිළිබඳ අද්මිනිස්ත්‍රාසිය තමාට ප්‍රදානය කරන ලෙස

ඉල්ලා සිටිනම්, එවිට ආඥාවෙහි, අන්තිම කැමති පත්‍රය අනුව මිය ගිය තැනැත්තාගේ දේපළ අද්මිනිස්ත්‍රාසි කිරීම සඳහා වූ බලය අන්තිම කැමති පත්‍රයේ පිට පතක් අමුණා ඉල්ලුම්කරුට ප්‍රදානය කිරීමක් ඇතුළත් විය යුතු ය;

(ආ) 528 වන වගන්තිය යටතේ වූ ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් වූ විට—

(i) මෙහි මින් මතු නියම කරනු ලැබ ඇති කොන්දේසිවලට යටත්ව පෙත්සම්කරුට අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා ආඥාවක් කළ යුතු ය; නැතහොත්

(ii) පළමුවන උපලේඛනයේ අංක 87අ ආකෘතිය අනුව උරුමක්කාරභාවය පිළිබඳ සහතිකයක් ඉල්ලුම්පත්‍රයේ සඳහන් එක් එක් උරුමක්කාරයාට, උරුමක්කාරයන් එකග වී ඇත්නම්, එක් එක් උරුමක්කාරයාට හිමි බුදලයේ පංගුව ද සඳහන් කර, නිකුත් කිරීම සඳහා ආඥාවක් කළ යුතු ය.

(ඇ) 528 වන වගන්තිය යටතේ උරුමක්කාරභාවය පිළිබඳ සහතික නිකුත් කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් සම්බන්ධයෙන් වූ විට, බුදලය අද්මිනිස්ත්‍රාසි කිරීම සඳහා යම් තැනැත්තකු පත් කිරීම අවශ්‍ය බව අධිකරණයේ මතය වේ නම්, උරුමක්කාරභාවය පිළිබඳ සහතික නිකුත් කිරීම වෙනුවට මෙහි මින් මතු නියම කර ඇති කොන්දේසිවලට යටත්ව අද්මිනිස්ත්‍රාසිය ලබා ගැනීමට හිමිකම් ඇති තැනැත්තකුට අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ප්‍රදානය කිරීම සඳහා ආඥාවක් කළ යුතු ය.

(2) ඉහත (1) (ආ) (ii) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද උරුමක්කාරභාවය පිළිබඳ සහතික, එහි සඳහන් මියගිය තැනැත්තාගේ සත්‍ය උරුමක්කාරයන් පිළිබඳ ප්‍රමාණවත් ඔප්පු කිරීමක් විය යුතු අතර අන්තිම කැමති පත්‍රයක් නොමැති අවස්ථාවක දී උපචිත වන යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් වෙනුවෙන් යම් පංගුවකට හිමිකම් පෑමේ කාර්යය සඳහා ඒවා ඉදිරිපත් කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කිරීමේ කාර්යය සඳහා ප්‍රොබේට් නිලධරයා විසින්, ප්‍රස්තුත ඉල්ලුම්පත්‍රයට අදාළ සියලු ලියකියවිලි, එම ඉල්ලුම්පත්‍රය සම්බන්ධයෙන් 529 වන වගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පසු දින දිසා විනිශ්චයකාරවරයාගේ නිල කාමරයේදී දිසා විනිශ්චයකාරවරයාට ඉදිරිපත් කළ යුතු අතර, අධිකරණය විසින් නොපමාවම උචිත ආඥාවක් කළ යුතු ය.

524 හෝ 528 වන වගන්ති යටතේ ඉල්ලුම් පත්‍රවලට විරෝධතා ඇති විට කාර්ය පටිපාටිය.

532. (1) 529 වන වගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමකට ප්‍රතිචාර වශයෙන් 524 වන හෝ 528 වන වගන්තිය යටතේ වූ යම් දැන්වීමක් සම්බන්ධයෙන් යම් විරෝධතා, එම ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් දින හෝ ඊට පෙර ලැබුණහොත්, මෙහි විධිවිධාන සලස්වා ඇති කාර්ය පටිපාටිය අනුව එකී ඉල්ලුම් පත්‍රය අසා විභාග කර තීරණය කිරීමට අධිකරණය විසින් කටයුතු කළ යුතු අතර, එම කාර්යය සඳහා එම ඉල්ලුම් පත්‍රය අවසාන වශයෙන් විභාග කර සුදුස්සක් කිරීමට දිනයක් නියම කළ හැකි ය. තවද, මෙහි 541 වන වගන්තිය අනුව අවශ්‍ය යයි අධිකරණ විසින් අදහස් කරනු ලබන ආඥාවක් ඊට අතිරේකව කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කිරීමේ කාර්යය සඳහා ප්‍රොබේට් නිලධරයා විසින් ප්‍රස්තුත ඉල්ලුම් පත්‍රයට අදාළ සියලු ලියකියවිලි 529 වන වගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පසු දින දිසා විනිශ්චයකාරවරයාගේ නිල කාමරයේ දී දිසා විනිශ්චයකාරයාට ඉදිරිපත් කළ යුතු ය.

උරුමක්කාර භාවය පිළිබඳ සහතිකය ක්‍රියා කිරීමේ ප්‍රතිඵලය අනුව බලපෑම.

532අ. 531 (1) (ආ) (ii) වන වගන්තිය යටතේ දිසා අධිකරණයක් විසින් නිකුත් කරන ලද උරුමක්කාරභාවය පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කළ විට, ඒ උරුමක්කාර භාවය පිළිබඳ සහතිකය අනුව, යම් බැංකුවක් හෝ ආයතනයක් විසින් යම් මුදලක්, චංචල දේපලක් හෝ සහතිකයක්, ඊට හිමිකම ඇති යම් උරුමක්කාරයකුට භාර දී හෝ පවරා ඇති අවස්ථාවක, එකී භාරදීම හෝ පැවරීම, එම උරුමක්කාරභාවය පිළිබඳ සහතිකය එසේ නිකුත් කලේ යම් මියගිය තැනැත්තකුගේ මුදලය සම්බන්ධයෙන් ද ඒ මියගිය තැනැත්තාට ඇති බැඳීමක් ඉටු කිරීමක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

අවසාන විභාගයේ දී විසඳිය යුතු ප්‍රශ්න අධිකරණය විසින් නැගිය යුතු බව.

533. (1) වන වගන්තිය යටතේ අවසාන විභාගය සඳහා නියම කරන ලද දින හෝ එය යම් දිනයකට යථා පරිදි අඩාලව කල් තබනු ලැබුවේ නම් ඒ දින, විරෝධතා හෝ හිමිකම් පෑම ඉදිරිපත් කරන තැනැත්තන් විසින්, වාචික සාක්ෂි මත නඩු විභාග කළ යුතු අන්දමේ හේතු සහිත විරෝධය පෑම් ඉල්ලීමට විරුද්ධව ඇතැයි අධිකරණය සෑහීමට පත් කරනු ලැබුවහොත්, පාර්ශ්වකරුවන් අතර පැන නගින බව පෙනී යන විසඳිය යුතු ප්‍රශ්න අධිකරණය විසින් නඟා, 386 වන වගන්තිය යටතේ ඒ කාර්යය සඳහා නියම කරනු ලබන දිනයක ඒවා පිළිබඳ නඩු විභාග කරන ලෙස අධිකරණය විසින් විධාන කළ යුතු ය.

අවසාන නඩු විභාගයේ දී කළ හැකි ආඥා.

534. (1) අවසාන නඩු විභාගයේ දී හෝ උක්ත පරිදි නගන ලද විසඳිය යුතු ප්‍රශ්න පිළිබඳ තීරණය කිරීමෙහි දී—

(අ) ඉල්ලුම් පත්‍රයෙහි වැදගත් කරුණු කියාපෑම් බැලූ බැල්මට පිළිගත හැකි සේ ඔප්පු කරන සාක්ෂි බිඳහෙලා නැති බව අධිකරණයට පෙනී යන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි ප්‍රොබේට් බලපත්‍රය, හෝ අන්තිම කැමති පත්‍රය ඇමුණු අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ප්‍රදානය හෝ, අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය පමණක් හෝ මෙහි මින් මතු නියම කෙරෙන කොන්දේසිවලට යටත්ව ප්‍රදානය කිරීමට හෝ උරුමක් කාරභාවය පිළිබඳ සහතික නිකුත් කිරීමට නොපමාව ආඥා කළ යුතු ය ; හෝ

(ආ) පෙත්සමෙහි වැදගත් කරුණු කියාපෑම් බැලූ බැල්මට පිළිගත හැකි සේ ඔප්පු කරන සාක්ෂි බිඳ හෙලන ලද බව අධිකරණයට පෙනී යන්නේ නම්, එවිට අධිකරණය විසින් පෙත්සම නිශ්ප්‍රභ කළ යුතු අතර විසඳිය යුතු ප්‍රශ්න පිළිබඳ ඒ විභාගයේදී හෝ නඩු විභාගයේදී විරෝධතා ඉදිරිපත් කර ඇති යම් තැනැත්තකු විසින් ප්‍රොබේට් බලපත්‍රය හෝ මියගිය තැනැත්තාගේ දේපළ පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ප්‍රදානය හෝ පෙත්සම්කරු වෙනුවට තමාට ප්‍රදානය කරවා ගැනීමට ඔහුට ඇති අයිතිවාසිකම තහවුරු කරනු ලැබුවහොත් අධිකරණය විසින් ඒ බවට ඔහුගේ වාසියට තවදුරටත් ආඥාවක්, මෙහි මින්මතු නියම කර ඇති කොන්දේසිවලට යටත්ව කළ යුතුය ; හෝ

(ඇ) උරුමක්කාරයකු වශයෙන් පෙත්සමේ ලැයිස්තුගත කර ඇති යම් තැනැත්තකු ඇත්ත වශයෙන්, උරුමක්කාරයකු නොවන බව හෝ උරුමක්කාරයකු වශයෙන් පෙත්සමේ ලැයිස්තුගත කර නොමැති වෙනත් යම් තැනැත්තකු උරුමක්කාරයකු වශයෙන් පිළිගනු ලැබීමට ඔහුගේ අයිතිවාසිකම ඔප්පු කර ඇති බව අධිකරණයට පෙනී යන්නේ නම් එවිට අධිකරණය විසින් ඒ අනුව ආඥාවක් කළ යුතු ය; හෝ

(ඈ) යම් මියගිය තැනැත්තකුගේ උරුමක්කාරයන්ට උරුමක්කාර භාවය පිළිබඳ සහතික නිකුත් කිරීම සඳහා වූ ඉල්ලීමක දී, ඒ වෙනුවට ඒ මියගිය තැනැත්තාගේ බූදලය පාලනය කිරීම සඳහා අද්මිනිස්ත්‍රාසි බල පත්‍රය ප්‍රදානය කළ යුතු බව අධිකරණයට පෙනී යන්නේ නම්, එවිට අධිකරණය විසින් මෙ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ලබා ගැනීමට හිමිකම් ඇති යම් තැනැත්තකුට මෙහි මින්මතු නියම කරනු ලැබ ඇති කොන්දේසිවලට යටත්ව අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා ආඥාවක් කළ යුතු ය.

(2) මේ ඉල්ලීමට සම්බන්ධ අවස්ථාවෙහි දී හෝ ඊට පසුව හෝ මියගිය තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රය පිළිබඳ ප්‍රොබේට් බලපත්‍රය හෝ ඔහුගේ දේපළ පිළිබඳව අද්මිනිස්ත්‍රාසි බලය පෙත්සම්කරු හැර වෙනත් තැනැත්තකුට ප්‍රදානය කරනු නොලැබ ඇතිතාක් කල්, පෙත්සම්කරු විසින් ඉල්ලීම නැවත අලුත් කිරීමට, යම් පෙත්සමක් නිෂ්ප්‍රභ කරනු ලැබීම බාධාවක් නොවිය යුතු ය.

අද්මිනිස්ත්‍රාසි කරුවකු ලෙස හෝ පොල්මා කරුවකු ලෙස සංස්ථාවක් පත් කරන ලද අවස්ථාවක කාර්ය පටිපාටිය

535. (1) තනිව හෝ වෙනත් තැනැත්තකු සමග හවුලේ හෝ අන්තිම කැමති පත්‍රයක් යටතේ පොල්මාකරුවකු වශයෙන් සංස්ථාවක් පත් කරනු ලැබූ අවස්ථාවක, අවස්ථානුකූලව අවශ්‍ය වන පරිදි අධිකරණය විසින් එම සංස්ථාවට තනිව හෝ ඒ වෙනත් තැනැත්තා සමග හවුලේ හෝ ප්‍රොබේට් බලපත්‍රය ප්‍රදානය කරනු ලැබිය හැකි අතර, ඒ අනුව සංස්ථාවට පොල්මාකරු වශයෙන් ක්‍රියා කළ හැකි ය.

(2) යම් සංස්ථාවකට තනිව හෝ වෙනත් තැනැත්තකු සමග හවුලේ හෝ අද්මිනිස්ත්‍රාසි බල පත්‍රය ප්‍රදානය කරනු ලැබිය හැකි අතර, ඒ අනුව

සංස්ථාමට අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් ක්‍රියා කළ හැකි ය.

(3) ඒ සංස්ථාව විසින් තත්කාර්යයන් සඳහා බලය දෙන ලද යම් නිලධරයකු විසින් සංස්ථාව වෙනුවෙන් දිවුරුම් පත්‍ර දිවුරවීම ද, ධුරය පිළිබඳ දිවුරුම් දීම ද, ඇප තැබීම ද, අධිකරණය විසින් නියම කරනු ලබන වෙනත් යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීම ද කළ හැකි අතර, ඒ නිලධරයාගේ ක්‍රියාවලින් සංස්ථාව බැඳී සිටින්නේ ය.

කේවියට් තහනමක් ඉදිරිපත් කළ හැක්කේ කවුරුන් විසින් ද යනවග.

536. 529 වන වගන්තිය යටතේ වූ දැන්වීම පළ කිරීමෙන් පසු හා පෙත්සමේ අවසාන විභාගයට පෙර යම් අවස්ථාවක, පෙත්සමේ නිශ්චිතව සඳහන් වන්නා වූ තැනැත්තකු නොවූවත්, එකී අන්තිම කැමති පත්‍රය හෝ එකී මිය ගිය තැනැත්තාගේ දේපළ හෝ බූදලය පිළිබඳ සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකුට, පෙත්සම්කරුගේ ඉල්ලීමට ඉඩදීමට විරුද්ධව පළමුවන උපලේඛනයේ අංක 93 දරන ආකෘතියෙහි දක්වා ඇති පරිදි කේවියට් තහනමක් හෝ එයට විරුද්ධ වන බවට වූ දැන්වීමක් හෝ එම අධිකරණය වෙතම ඉදිරිපත් කිරීමෙන් මැදිහත් වීමට බලය ඇත්තේය. තවද ඒ තැනැත්තාට විරෝධතා ඇත්නම් ඒවා ඉදිරිපත් කිරීමට අධිකරණය විසින් ඔහුට අවසර දිය හැකි අතර, පෙත්සමේ අවසාන විභාගය අඛාලව කල් තැබිය හැකි ය.

ප්‍රොබේට් බලපත්‍රය අද්මිනිස්ත්‍රාසි බල ප්‍රදානය, හෝ උරුමක්කාර භාවය පිළිබඳ සහතිකය ආපසු කැඳවා, අවලංගු කිරීමට, හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට ඇති බලය.

537. උරුමක්කාරභාවය පිළිබඳ සහතිකයක් හෝ මියගිය තැනැත්තකුගේ අන්තිම කැමති පත්‍රය පිළිබඳ ප්‍රොබේට් බල පත්‍රය ප්‍රදානය කරනු ලැබ තිබෙන හෝ මියගිය තැනැත්තකුගේ දේපළ පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බලය ප්‍රදානය කරනු ලැබ තිබෙන හෝ යම් අවස්ථාවක, සහතිකය නිකුත් නොකළ යුතුව තිබුණු බවට හෝ, අන්තිම කැමති පත්‍රය ඔප්පු වූ බව තීරණය නොකළ යුතුව තිබුණු බවට හෝ ප්‍රොබේට් බල පත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලය ප්‍රදානය නොකළ යුතුව තිබුණු බවට සෑහීමට පත්වීමෙන් පසු එකී සහතිකය අවලංගු කිරීමට හෝ ඒ ප්‍රොබේට් බල පත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ ආපසු කැඳවා ඒ ප්‍රදානය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට දිසා අධිකරණයට බලය ඇත්තේය. තවද ඒ ප්‍රොබේට් බල පත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බල ප්‍රදානය ගෝ යටතේ අද්මිනිස්ත්‍රායි කිරීම නොකළ හැකි බවට හෝ නිෂ්ප්‍රයෝජන බවට පත් කරවන තත්ත්වයක් උද්ගත වී ඇතැයි සෑහීමට පත් වූ යම් අවස්ථාවක ප්‍රොබේට් බල පත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලය ප්‍රදානය ආපසු කැඳවීමට දිසා අධිකරණයට බලය ඇත්තේ ය.

ආපසු කැඳවීම ආදිය සඳහා වූ ඉල්ලුම් පත්‍රය.

538. උරුමක්කාරභාවය පිළිබඳ සහතිකය ප්‍රොබේට් බලපත්‍ර හෝ අද්මිනිස්ත්‍රාසි බල ප්‍රදානය අවලංගු කිරීම, ආපසු කැඳවීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා කෙරෙන සියලුම ඉල්ලීම් ලඝු කාර්ය පටිපාටිමය රීති අනුව පෙත්සමක් මගින් කළ යුතු ය. එවැනි ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට පෙත්සම්කරුට අධිකරණයේ මතය අනුව හිමිකම් ලැබෙන සම්බන්ධතාවක් මිය ගිය තැනැත්තාගේ බූදලයෙහි ලා ඔහුට ඇති බව පෙත්සම්කරු පෙත්සමෙහි දක්වා ඇත්නම් මිස එවැනි කිසිදු ඉල්ලීමක් භාර නොගත යුතු ය.

දේපළ ලැයිස්තුව හා තක්සේරුව.

539. (1) මිය ගිය තැනැත්තකුගේ අන්තිම කැමති පත්‍රය පිළිබඳ ප්‍රොබේට් බල පත්‍රය හෝ මිය ගිය තැනැත්තකුගේ දේපළ පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බල ප්‍රදානය හෝ තමන් වෙත ප්‍රදානය කරවා ගැනීමට යම් තැනැත්තකුට හිමිකම් ඇති බව ප්‍රකාශ කරමින් දිසා අධිකරණයක් විසින් ආඥාවක් කරනු ලැබූ සෑම අවස්ථාවක ම, එම ආඥාව කරනු ලැබීමෙන් පසු දින පහළොවක් ඇතුළත පළමුවන උපලේඛනයෙහි අංක 92 දරන ආකෘතියෙහි දක්වා ඇති පරිදි පොල්මෑකරුවකුගේ හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ දිවුරුම දීමද, ඉන්පසු දිවුරුම දීමෙන් එක් මාසයක කාලයක් ඇතුළත මිය ගිය තැනැත්තාගේ දේපළ හා බඩු බාහිරාදිය පිළිබඳ තක්සේරුවක් සමග ඒ දේපළ හා බඩු බාහිරාදිය පිළිබඳ ලැයිස්තුවක් පළමුවන උපලේඛනයේ අංක 92 දරන ආකෘතියෙහි දක්වා ඇති පරිදි අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු වන අතර, අධිකරණය විසින්, අවස්ථාවෝචිත පරිදි, ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය නොපමාව ප්‍රදානය කළ යුතු ය.

(2) යම් තැනැත්තකුට 531 (1) (ආ) (ii) වන වගන්තිය යටතේ උරුමක්කාරභාවය පිළිබඳ සහතිකයක් නිකුත් කරනු ලැබීමට හිමිකම ඇති බව ප්‍රකාශ කෙරෙන ආඥාවක් කරනු ලැබූ පසු, අධිකරණය විසින්, ඒ තැනැත්තාට එම සහතිකය නොපමාව නිකුත් කළ යුතු ය.

සීමිත ප්‍රොබේට් බලපත්‍ර හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර.

540. ප්‍රදානය බල පවත්නා කාලය සම්බන්ධයෙන් හෝ එය යටතේ අද්මිනිස්ත්‍රාසි කෙරෙන දේපළ සම්බන්ධයෙන් හෝ ඒ ප්‍රදානයෙන් පවරනු ලැබූ දේපළ පිළිබඳව ක්‍රියා කිරීමේ බලය සම්බන්ධයෙන් හෝ සීමා නියම කරමින් පහත දැක්

වෙත අවස්ථාවන් හි දී ප්‍රොබේට් බලපත්‍ර ප්‍රදානයක් හෝ අද්මිනිස්ත්‍රාසි බල ප්‍රදානයක් කිරීමට දිසා අධිකරණයට බලය ඇත්තේ ය :—

(අ) අන්තිම කැමති පත්‍රකරුගේ මරණයෙන් පසු ඔහුගේ අන්තිම කැමති පත්‍රයේ මුල් පිටපත නැතිව එහෙත්, එහි පිටපතක් ආරක්ෂා වී තිබෙන විට, එම පිටපත පිළිබඳ ප්‍රොබේට් බලපත්‍රය, මුල් පිටපත අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන තෙක් සීමා කොට ප්‍රදානය කළ හැකි ය.

(ආ) ඒ හා සමාන සිදුවීමක දී, පිටපතක් ආරක්ෂා වී නැත්නම්, එහි සීමාවම සහිතව අන්තිම කැමති පත්‍රයේ කෙටුම්පතක් පිළිබඳ ප්‍රොබේට් බලපත්‍රය ප්‍රදානය කළ හැකි ය, නැතහොත්, ඊට අමතරව කෙටුම්පතක් ද ලබා ගත නොහැකි නම්, සාක්ෂිවලින් තහවුරු කළ හැකි තාක් දුරට අන්තිම කැමති පත්‍රයෙහි ඇතුළත් කරුණු හෝ එහි සාරාර්ථය හා ප්‍රතිඵලය පිළිබඳ ප්‍රොබේට් බලපත්‍රය ප්‍රදානය කළ හැකි ය.

(ඇ) ලංකාවෙන් පිටත පදිංචිව සිටින්නා වූ ද පොල්මෑකරුට අන්තිම කැමති පත්‍රයේ මුල් පිටපත දීමට බල කළ නොහැක්කා වූ ද යම් තැනැත්තකු වෙත අන්තිම කැමති පත්‍රයේ මුල් පිටපත තිබෙන අවස්ථාවක, සහ පොල්මෑකරු පිටපතක් ඉදිරිපත් කරයි නම්, මුල් පිටපත අධිකරණය වෙත ඉදිරිපත් කරන තෙක් සීමා කොට ඒ පිටපත පිළිබඳ ප්‍රොබේට් බලපත්‍රය ප්‍රදානය කළ හැකි ය. එහෙත් අන්තිම කැමති පත්‍රය ශ්‍රී ලංකාවෙන් පිටත දී යථා පරිදි ඔප්පු කර ඇත්තේ නම් විදේශීය ප්‍රොබේට් බලපත්‍රය නිසි සේ ආදර්ශයක් වශයෙන් ගනිමින් ප්‍රදානයෙහි ලා කිසිදු සීමාවක් නොකොට ප්‍රොබේට් බලපත්‍රය පොල්මෑකරුට ප්‍රදානය කළ හැකි ය.

(ඈ) අන්තිම කැමති පත්‍රයක එකම පොල්මෑකරු ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටි නම් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පොල්මෑකරුවන් සිට ඔවුන් සියලු දෙනාම ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටිත් නම්, නැතහොත් ශ්‍රී ලංකාවෙහි පදිංචි පොල්මෑකරුවන් ක්‍රියා කිරීමට අකමැත්ත පළකරත් නම්, පොල්

මෑකරුගේ හෝ පොල්මෑකරුවන්ගේ ඇටෝර්නි බලකරු වශයෙන් එකී කාර්යය සඳහා ඇටෝර්නි බලපත්‍රයකින් පත් කළ යුතු වූ ද ශ්‍රී ලංකාව තුළ වූ ද යම් තැනැත්තකුට අන්තිම කැමති පත්‍රයේ පිටපතක් ඇමුණූ අද්මිනිස්ත්‍රාසි බලය අධිකරණය විසින් ප්‍රදානය කළ හැකි ය. එසේ කරනු ලබන ප්‍රදානය, පොල්මෑකරු හෝ පොල්මෑකරුවන්ගෙන් කෙනකු හෝ ඉදිරිපත් වී තමා සඳහා ප්‍රොබේට් බලපත්‍රය ලබා ගන්නා තෙක්, මූලිකයාගේ ප්‍රයෝජනය හා ප්‍රතිලාභය සඳහා සීමා කළ යුතු ය. ඉහත සඳහන් හේතුවලින් එකක් නිසා, මුල් පිටපත ඉදිරිපත් නොවීමේ හේතුව කරණ කොටගෙන මේ අවස්ථාවෙහි දී ඔප්පු කිරීම සඳහා ආවේශ්‍ය කරන ලද ලේඛනය මුල් පිටපතෙහි පිටපතක් හෝ මුල් පිටපත වෙනුවෙන් වූ ආදේශයක් වේ නම්, මුල් පිටපත අධිකරණය වෙත ඉදිරිපත් කරන තෙක් ප්‍රදානය තවදුරටත් සීමා කළ යුතු ය:

තව ද එසේම, එක් පොල්මෑකරුවකුට වැඩි සංඛ්‍යාවක් පොල්මෑකරුවන් සිටින අවස්ථාවක දී, ඉල්ලුම් කරන තැනැත්තා සියලුම පොල්මෑකරුවන්ගේ ඇටෝර්නි බලකරු නොවේ නම්, ඉතිරි පොල්මෑකරුවන් ක්‍රියා කිරීමට අකමැත්ත පළ කරන තෙක් ඒ තැනැත්තාට අද්මිනිස්ත්‍රාසි බලය ප්‍රදානය නොකළ යුතු ය.

(ඉ) අන්තිම කැමති පත්‍රයක් සම්බන්ධයෙන් වූ විට, ක්‍රියා කිරීමට කැමති කිසිම පොල්මෑකරුවකු ශ්‍රී ලංකාව තුළ නොමැති අවස්ථාවක, මූලිකයා පැමිණ තමා සඳහා අද්මිනිස්ත්‍රාසි බලය ලබාගන්නා තෙක් සීමා කොට, ප්‍රර්වාසි ශේෂ තෙස්තමේන්තු දායාද ලාභියකුගේ හෝ උරුමක්කාරයකුගේ ඇටෝර්නි බලකරුට අන්තිම කැමැති පත්‍රයේ පිටපතක් ඇමුණූ අද්මිනිස්ත්‍රාසි බලය ප්‍රදානය කළ හැකි ය; එසේ නැත හොත්, මීට සමාන අවස්ථාවක දී, බාල වයස් කාලයට සීමා කොට ශ්‍රී ලංකාව තුළ සිටින බාල වයස්කාර ශේෂ තෙස්තමේන්තු දායාද ලාභියකුගේ භාරකරුට හෝ සිහි විකල කාලයකට සීමා කොට ශ්‍රී ලංකාව තුළ සිටින සිහි විකල ශේෂ තෙස්තමේන්තු දායාද ලාභියකුගේ බූදලයෙහි කළමනාකරුට හෝ ඒ ප්‍රදානය කළ හැකි ය.

(ඊ) අන්තිම කැමති පත්‍රයක් නොමැති අවස්ථාවක දී, බාල වයස්කාර උරුමක්කාරයකුගේ භාරකරුට හෝ සිහි විකල උරුමක්කාරයකුගේ බුදලයෙහි කළමනාකරුට හෝ ඉහත කී ආකාරයෙන් සීමා කොට මියගිය තැනැත්තාගේ දේපළ පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බල ප්‍රදානය කළ හැකි ය.

(උ) වඩා විශාල ප්‍රදානයක් අනවශ්‍ය යයි අධිකරණය සලකන යම් අවස්ථාවක දී, යම් විශේෂිත දේපළකට සීමා කොට හෝ යම් විශේෂිත කාර්යයකට සීමා කොට අධිකරණය විසින් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලය ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

ඉහත දැක්වුණු සියලුම අවස්ථාවන්හි දී අධිකරණය විසින් සීමිත ප්‍රදානයක් කිරීම යුක්ති සහගත බවට පත් කිරීමට අවශ්‍ය වැදගත් හා අදාළ සිද්ධීන්, ඉල්ලුම් කරන පෙත්සමෙහි දක්වනු ලැබිය යුතු අතර, ආඥාව කිරීමට පෙර බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂිවලින් ඒවා තහවුරු කළ යුතු ය.

නඩුව පවතින අතර අද්මිනිස්ත්‍රාසි කිරීම.

541. (1) මියගිය තැනැත්තකුගේ අන්තිම කැමති පත්‍රයෙහි වලංගු භාවයට සම්බන්ධ වූ හෝ ප්‍රොබේට් බලපත්‍ර හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ප්‍රදානය ලබා ගැනීම ආපසු කැඳවීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා වූ හෝ උරුමක්කාර භාවය පිළිබඳ සහතිකය ලබාගැනීම සඳහා වූ යම් නඩු කටයුත්තක් නොනිමිව පවතින අවස්ථාවක, අනවශ්‍ය ප්‍රමාදයක් ඇතිවීමේ හේතුව මත හෝ යම් ප්‍රමාණවත් හේතුවක් මත අධිකරණය විසින්—

(i) මියගිය තැනැත්තාගේ බුදලය පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය, ඒ නඩු කටයුත්ත පවත්නා කාලයට සීමා කොට, අද්මිනිස්ත්‍රාසිකරුවකුට නිකුත් කළ හැකි ය. එනමුත් එම අද්මිනිස්ත්‍රාසිකරු කෙළින්ම අධිකරණයේ පාලනයට යටත් විය යුතු අතර, අධිකරණයේ විධාන යටතේ ක්‍රියා කළ යුතු ය. තවද එම බුදලය බෙදා හැරීමේ අයිතිවාසිකම ඔහුට නොලැබිය යුතු ය ; හෝ

(ii) මියගිය තැනැත්තකුගේ බුදලයට අයත් යම් දේපළක් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කරනු ලැබීමට පෙර විකිණීම අවශ්‍ය වුවහොත්, අධිකරණය විසින් එම දේපළ විකිණීමේ

කාර්යයට සීමා කොට බලපත්‍රය ප්‍රදානය කරනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවක, එම දේපළ එම ප්‍රදානයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු අතර, එම බල පත්‍ර නිකුත් කරනු ලබන්නේ පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව බවද එම ප්‍රදානයෙහි ප්‍රකාශිතව සඳහන් විය යුතු ය :—

(අ) විකිණීම කරනු ලබන්නේ පෞද්ගලික ගිවිසුමක් මගින් නම් අධිකරණය විසින් නියම කරනු ලබන මිලකට විකිණීම කළ යුතු බව, නැතහොත් විකිණීම කරනු ලබන්නේ දැන්වීම් පළ කරනු ලැබීමෙන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී නම් මුල් ලංසුවේ මිලට හෝ වෙනත් මිලකට විකිණීම කළ යුතු බව;

(ආ) විකිණීමෙන් ලත් ශුද්ධ ආදායම අධිකරණය විසින් නියම කරනු ලබන කාලයක් ඇතුළත අධිකරණයෙහි තැන්පත් කළ යුතු බව;

(ඇ) අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය නිකුත් කරනු ලැබූ අද්මිනිස්ත්‍රාසිකරුට, අධිකරණය විසින් විකිණීම ස්ථිර කරනු ලැබීමට පෙර නිශ්චල දේපළක් හිමිකර දීමේ යම් ඔප්පුවක් ලියා අත්සන් කිරීමට බලය පවරා නොමැති බව ; හා

(ඈ) අවස්ථාගත කරුණු අනුව පැනවීම සුදුසු යයි අධිකරණය සලකන වෙනත් යම් කොන්දේසියක්

(2) මේ වගන්තිය යටතේ බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා ආඥවක් කිරීමට පෙර ~~ප්‍රොබේට් බල පත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ උරුමක්කාර භාවය පිළිබඳ සහතිකය සඳහා ඉදිරිපත් කරන ලද මුල් පෙත්සමේ වගඋත්තරකරුවන්~~ට ඉල්ලීම ගැන දැනුම් දිය යුතු අතර, ඔවුන් විසින් හෝ බූදලය කෙරෙහි සම්බන්ධතාවක් ඇති වෙනත් යම් තැනැත්තකු විසින් හෝ එම විකිණීම පිළිබඳව කැමැත්ත දක්වා ඇත්නම් මිස, ඊට විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමට ඔවුන්ට ඉඩ දිය යුතු ය.

අද්මිනිස්ත්‍රාසි යෙහි බලය සීමා කරනු නොලැබූ අවස්ථාව

542. ප්‍රදානය කෙරෙන්නේ යම් ආඥාවක් මගින් ද ඒ ආඥාවේ එම ප්‍රදානය පිළිබඳව කිසිදු සීමාවක් ප්‍රකාශිතව නොමැත්තේ නම්, ප්‍රොබේට් බලපත්‍රය ප්‍රදානය කිරීමෙන් සැබෑ බවට සහතික කරන්නා වූ හෝ අද්මිනිස්ත්‍රාසි බල ප්‍රදානය නිකුත් කිරීමෙන් හිමිකර දෙනු ලබන්නා වූ අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලය, ශ්‍රී ලංකාව තුළ පිහිටි මියගිය තැනැත්තාගේ චංචල හා නිශ්චල දේපළවල ඒ මියගිය තැනැත්තා ගේ නොවන බවට 554අ වගන්තිය යටතේ පළ කරනු ලබන දේපළ හෝ ඒ දේපළවල අද්මිනිස්ත්‍රාසි නොකරන ලද යම් ප්‍රමාණයක් වේ නම් ඒ ප්‍රමාණය හැර, ඒ සෑම කොටසක් ම කෙරෙහි ව්‍යාප්ත වන අතර, පොල්මෑකරුගේ හෝ අද්මිනිස්ත්‍රාසිකරුගේ මරණය සහ එකී සම්පූර්ණ දේපළ අද්මිනිස්ත්‍රාසි කරණය නිමවීම යන මෙයින් පළමුවෙන් වන සිදු වීම තෙක් ඒ අද්මිනිස්ත්‍රාසි බලය ස්ථායිව පවත්නේ ය.

දේපළ එක්රැස් කිරීමේ බලපත්‍ර.

543. ශ්‍රී ලංකාවෙහි දේපළ තබා යම් තැනැත්තකු මිය ගියහොත්, ඒ දේපළ පිහිටා තිබෙන්නේ යම් දිස්ත්‍රික්කයක ද ඒ දිස්ත්‍රික්කයේ අධිකරණයෙහි විනිශ්චයකාරවරයා සෑහීමට පත්වන පරිදි සිද්ධිවල නිරවද්‍යතාව ස්ථිර කරනු ලැබීමෙන් පසුව සහ එසේ මියගිය තැනැත්තාගේ දේපළ අද්මිනිස්ත්‍රාසි කිරීමට හිමිකම් ඇති යම් ළඟම නෑයකු හෝ වෙනත් තැනැත්තකු ශ්‍රී ලංකාව තුළ නොසිටින බව ඔහුට පෙන්වනු ලැබූ විට, ඒ දේපළ අද්මිනිස්ත්‍රාසි කිරීමට පොල්මෑකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසි කරුවකු හෝ ඔහු වෙත උරුමක්කාර භාවය පිළිබඳ සහතිකයක් නිකුත් කරනු ලැබ ඇති යම් උරුමක්කාරයකු ඒ සඳහා හිමිකම් ඉදිරිපත් කරන තුරු, ඒ දේපළ භාර ගැනීම සඳහා වගකිව යුතු තැනැත්තකුට හෝ තැනැත්තන් වැඩි දෙනකුට පළමුවන උපලේඛනයෙහි අංක 91 දරන ආකෘතිය අනුව වූ දේපළ එක්රැස් කිරීමේ බලපත්‍රයක් ඒ විනිශ්චය කාරවරයා විසින් නිකුත් කළ යුතු ය.

නාමයෝජනය.

544. (1) වයස අවුරුදු දහසයට වැඩි වූද—

(අ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව යම් බලපත්‍රලත් වාණිජ බැංකුවක ඇති ජංගම ගිණුමක් නොවන, ගිණුමක ඇති මුදල් ;

(ආ) 1982 අංක 17 දරන සමාගම් පනතේ අර්ථකථනය කර ඇති පරිදි වූ සමාගමක යම් කොටසක් ;

(ඈ) 1961 අංක 2 දරන රක්ෂණ සංස්ථා පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් හෝ, 1979 අංක 22 දරන රක්ෂණ (විශේෂ විධිවිධාන) පනත යටතේ සංස්ථාගත කරන ලද යම් සංස්ථාවක් විසින් හෝ රක්ෂණ ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට බලයලත් සමාගමක් වශයෙන් 1962 අංක 25 දරන රක්ෂණ පාලන පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් සමාගමක් විසින් හෝ නිකුත් කරන ලද යම් ජීවිත රක්ෂණ ඔප්පුවක් ;

(ඇ) 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් මුදල් සමාගමක යම් තැන්පත් මුදලක් ;.

(ඉ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව යම් බලපත්‍රලත් වාණිජ බැංකුවක සුරක්ෂිතාගාරයක තැන්පත් කොට ඇති වෙනත් යම් චංචල දේපළක්

ඇත්තා වූ ද යම් තැනැත්තකු විසින් (මෙහි මින් මතු "නාමයෝජක" යනුවෙන් සඳහන් කරනු ලබන) එම තැනැත්තාගේ බැරට හෝ නමට ඇති එම මුදල්, කොටස හෝ වෙනත් චංචල දේපළ හෝ ඒ රක්ෂණ ඔප්පුව යටතේ ගෙවිය යුතු මුදල් ඔහුගේ මරණින් පසු ගෙවනු හෝ පවරනු ලැබිය යුතු (මෙහි මින් මතු "නාමිතයා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකුගේ නාම යෝජනා කළ හැකි ය.

(2) නාමයෝජකයේ අන්තිම කැමති පත්‍රයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, (1) වන උප වගන්තිය යටතේ කරන ලද නාමයෝජනයක් නාමයෝජකගේ මරණයෙන් පසු ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නාමයෝජනයක්, නාමයෝජකගේ ජීවිත කාලය තුළ දී නාමිතයා මියයාමෙන් හෝ (නාමයෝජකගේ අත්සන සහතික කළ යුතු) සාක්ෂිකරුවකු ඉදිරියේ නාමයෝජක විසින් අත්සන් කරන ලද ලියවිල්ලකින් වූ අවලංගු කිරීමේ දැන්වීමක් මගින් හෝ නාමයෝජක විසින් කරනු ලබන තදනන්තර නාමයෝජනයක් මගින් අවලංගු වන ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) නාමිතයාගේ සත්‍ය අනන්‍යතාවය පිළිබඳව නාමිතයා විසින් බැංකුව හෝ ආයතනය සෑහීමට පත්කරන්නේ නම් මිස, අවස්ථාවෝචිත පරිදි, බැංකුව හෝ ආයතනය විසින් කිසිම මුදලක්, සහතික හෝ වෙනත් චංචල දේපළ භාර නොදිය යුතු ය.

(5) මියගිය නාමයෝජකයකුගේ නාමිතයාට යම් මුදලක්, කොටස් සහතිකයක් හෝ තැන්පතු සහතිකයක් හෝ වෙනත් චංචල දේපළක් භාරදීම හෝ පැවරීම, එම නාමයෝජකයාගේ බැරට හෝ නමට ඇති මුදල් හෝ අනිකුත් චංචල දේපළ සම්බන්ධයෙන් හෝ එම රක්ෂණ ඔප්පුව යටතේ හෝ බැංකුවට හෝ ආයතනයට ඇති වගකීම් සම්පූර්ණයෙන් නිදහස් කිරීමක් විය යුතු ය.

ඇතැම් අවස්ථාවලදී නඩු පවත්වා ගෙන යා නොහැකි බව.

545. අන්තිම කැමති පත්‍රයක් තබා හෝ අන්තිම කැමති පත්‍රයක් නොතබා ශ්‍රී ලංකාවේ දී හෝ ඉන් පිටත දී මියගිය යම් තැනැත්තකුගේ බූදලයට හෝ බබු බාහිරාදියට අයත්වන හෝ ඇතුළත් වන ශ්‍රී ලංකාවේ පිහිටි චංචල හෝ නිශ්චල—

(අ) යම් දේපළක් ලබා ගැනීම සඳහා වූ යම් නඩු වක් පවත්වා ගෙන යාම;

සහ

(ආ) යම් දේපළ පැවරීමක් සිදු කිරීම ඒ තැනැත්තා මියගොස් ඇත්තේ එකී නඩුව පැවරීමට හෝ දේපළ පැවරීම සිදු කිරීමට පෙර අවුරුදු විස්සක් ඇතුළත දී නම්, වටිනාකම රුපියල් පන් ලක්ෂයක් හෝ ඊට වැඩිවන බූදලයක් සම්බන්ධයෙන් වන විට, ඒ තැනැත්තා අන්තිම කැමති පත්‍රය තබා මියගිය විටක ප්‍රොබේට් බලපත්‍රය ප්‍රදානය කර තිබේ නම් හෝ අන්තිම කැමති පත්‍රයක් නොතබා මියගොස් ඇති විට අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ උරුමක්කාර භාවය පිළිබඳ සහතිකය නිකුත් කර ඇත් නම් මිස, කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

සීමිත කාල යක් සඳහා පොල්මෑකරු පත් කරනු ලැබූ අවස්ථාවක ප්‍රොබේට් බලපත්‍රය.

546. යම් තැනැත්තකු සාමාන්‍යයෙන් අන්තිම කැමති පත්‍රයක පොල්මෑකරු වශයෙන් නොව අන්තිම කැමති පත්‍රයක විශේෂිත කාර්යයක් සඳහා පමණක් අන්තිම කැමති පත්‍රයේ පොල්මෑකරු වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්යයට පමණක් සීමා කොට ඔහුට ප්‍රොබේට් බල පත්‍රය ප්‍රදානය කළ යුතු ය.

අලුත් ප්‍රදානයකට ඉඩදෙන අවස්ථාව.

547. ප්‍රොබේට් බලපත්‍රය ප්‍රදානය කරනු ලැබූ තනි පොල්මෑකරු හෝ තනි ජීවත්ව සිටින පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසි බල ප්‍රදානයක් කරනු ලැබූ තනි අද්මින්ස්ත්‍රාසිකරු හෝ තනි ජීවත්ව සිටින අද්මිනිස්ත්‍රාසිකරු, මියගිය තැනැත්තාගේ දේපලෙහි කොටසක් අද්මිනිස්ත්‍රාසි නොකර මියගිය අවස්ථාවක, එසේ අද්මිනිස්ත්‍රාසි නොකර ඉතිරිව ඇති දේපල සම්බන්ධයෙන් අලුත් අද්මිනිස්ත්‍රාසි බල ප්‍රදානයක් මින්පෙර මෙහි ප්‍රථම ප්‍රදානයක් සඳහා නියමිත රීතිවලට අනුකූලව කළ හැකි ය.

වැරදි නිවැරදි කිරීම.

548. නම් හා විස්තර පිළිබඳ වැරදි හෝ මියගිය තැනැත්තා මියගිය වේලාව සහ ස්ථානය හෝ සීමිත ප්‍රදානයක කාර්යය හෝ දැක්වීමේ දී සිදුවූ වැරදි අධිකරණය විසින් නිවැරදි කරනු ලැබිය හැකි අතර, එසේ ප්‍රදානය කරන ලද හෝ නිකුත් කරන ලද ප්‍රොබේට් බලපත්‍ර, අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර, උරුමක්කාර භාවය පිළිබඳ සහතික ප්‍රදානය ද ඒ අනුව වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම කළ හැකි ය.

පොල්මෑකරුවන්ට සහ අද්මිනිස්ත්‍රාසිකරුවන්ට වන්දි.

549. පොල්මෑකරුවන් සහ අද්මිනිස්ත්‍රාසිකරුවන් විසින් විකුණන ලද දේපල වෙනුවෙන් මෙන්ම, විකුණනු නොලැබූ එහෙත් උරුමක්කාරයන් විසින් රඳවා ගනු ලැබූ දේපළ වෙනුවෙන් ද සියයට තුනක් නොඉක්මවන්නා වූ අනුප්‍රමාණයක් අනුව කොමිස් මුදලක ආකාරයෙන් පොල්මෑකරුවන්ට සහ අද්මිනිස්ත්‍රාසිකරුවන්ට වන්දි ලබා ගැනීමට ඉඩ දෙනු ලැබිය යුතු ය. තවද බූදලයෙහි සොයා ගනු ලබන මුදල් මත සහ විශේෂයෙන් රික්ථවරණය කරනු ලැබූ දේපළ වෙනුවෙන් ඒ පොල්මෑකරුවන් සහ අද්මිනිස්ත්‍රාසිකරුවන් විසින් විඳින ලද වෙහෙස ආශ්‍රිතව එක් එක් විශේෂ කාරණයට අදාළ අවස්ථාගත තත්ත්වයන් සැලකිල්ලට ගැනීමෙන් පසුව අධිකරණය විසින් තීරණය කරනු ලබන්නා වූ ද සියයට එක හමාරක් නොඉක්මවන්නා වූ අනු ප්‍රමාණයක් අනුව වන්දි ලබා ගැනීමට ඉඩ දෙනු ලැබිය යුතු ය. අධිකරණයේ මතය අනුව රුපියල් පන්දහසක මුදලකට වැඩි පාරිශ්‍රමිකයකට හිමිකම් ලැබෙන තරමේ අසාමාන්‍ය වෙහෙසක් යම් පොල්මෑකරුවකුට දරන්නට සිදුවූ බව අධිකරණයට පැහැදිලි වන්නේ නම් මිස, කිසිම අවස්ථාවක දී පොල්මෑකරුවකුට හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකුට රුපියල් පන් දහසකට වැඩි මුදලක් වන්දි වශයෙන් ඉඩ දෙනු නොලැබිය යුතු ය.

පොල්මෑකරු වන් කිහිප දෙනකුට ප්‍රතිදාන දීම.

550. පොල්මෑකරුවන් හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන් තුන් දෙනකුට වැඩි සංඛ්‍යාවක් සිටිනහොත් මිස තනි පොල්මෑකරුට හෝ අද්මිනිස්ත්‍රාසිකරුට නීතියෙන් ඉඩදී ඇති සම්පූර්ණ ප්‍රතිදානය ලැබීමට එක් එක් පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු හිමිකම් ලබන්නේ ය. තුන්දෙනාට හිමි ප්‍රතිදානය පිළිවෙළින් ඔවුන් විසින් ඉටු කරන ලද සේවය අනුව ඔවුන් සියලු දෙනා අතර විභජනය කළ යුතු අතර එක් පොල්මෑකරුවකුට හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකුට වැඩි සංඛ්‍යාවක් සිටින සියලුම අවස්ථාවල ද එවැනිම විභජනයක් කළ යුතු ය. එහෙත් පොල්මෑකරුවකුට හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකුට නිශ්චිත ප්‍රතිදානයක් දීමට අන්තිම කැමති පත්‍රයෙහි විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, නිශ්චිත ප්‍රතිදානය තමා අත්හරින බවට ලිඛිත දැනුම්දීමක් ඔහු අධිකරණය වෙත කළහොත් මිස, එසේ විධිවිධාන සලස්වා ඇති ප්‍රතිදානය හැර, වෙනත් දීමනාවක් ලැබීමට ඔහු හිමිකම් නොලබන්නේ ය.

ගණන් හිලව් ඉදිරිපත් කිරීම.

551. සෑම පොල්මෑකරුවකු හා අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බල ප්‍රදානය තමා වෙත නිකුත් කරන ලද දින සිට මාස දොළහක් ඉකුත් වන දිනයෙහි හෝ එදිනට පෙර හෝ අධිකරණය විසින් අවසර දෙනු ලබන යම් වැඩිදුර කාලයක් ඇතුළත හෝ දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් මත නිරවද්‍යතාව ස්ථිර කරන ලද, අවස්ථාවෝචිත පරිදි, තම පොල්මෑකාරකම හෝ අද්මිනිස්ත්‍රාසිය පිළිබඳ සත්‍ය හා අවසාන ගණන් හිලවු, ඊට සම්බන්ධ සියලු ලදුපත් හා වවුචර ද අමුණා, දිසා අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය. තව ද සිය අද්මිනිස්ත්‍රාසිය කරගෙන යාමේ දී තම අතට පත්ව තිබිය හැකි බාල වයස්කාරයකුට හෝ බාලවයස්කාරයන්ට හිමිකම් තිබිය හැකි යම් මුදලක් ඒ සමගම අධිකරණයට ගෙවිය හැකි ය :

එසේ වුවද යම් ගණන් හිලව් ඉදිරිපත් කිරීම හෝ මුදල් ගෙවීම අත්නොහැරියේ නම්, ගෙවිය යුතු මුද්දර ගාස්තුව ගෙවීම මත, පාර්ශ්වකරුවන් කැමති වන අවස්ථාවක ඒ ගණන් හිලව් ඉදිරිපත් කිරීම සහ මුදල් ගෙවීම අත්හැරිය යුතු අතර, එවිට නඩු කටයුතු අවසන් කළ යුතු ය.

එක් අවුරුද්දක් ඇතුළත අද්මිනිස්ත්‍රාසි කිරීම පැහැර හරින පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු පොලී ගෙවීමට බැඳී සිටින බව.

552. ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලය හෝ ප්‍රදානය කිරීමෙන් පසු එක් අවුරුද්දක් ඇතුළත දී ණය හිමියන්ට, උරුමක්කාරයන්ට, තෙස්තමේන්තු දායාද ලාභීන්ට හෝ වෙනත් තැනැත්තන්ට පිළිවෙළින් ඔවුන්ට හිමි මුදල් ප්‍රමාණයන් ගෙවීම යම් පොල්මෑකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් පැහැර හරිනු ලැබුව හොත්, ඒ කාලයෙන් පසු තමා වෙත රඳවාගත් මුදල් ප්‍රමාණයන් එසේ රඳවා ගැනීම ගැන පිළිගත හැකි සහ ප්‍රමාණවත් හේතු දැක්විය හැකි වුවහොත් මිස, එසේ රඳවා ගත් සියලුම මුදල් ප්‍රමාණයන් වෙනුවෙන් ඔහුගේම මුදලින් පොලී ගෙවීමට ඒ පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු බැඳී සිටින්නේ ය.

වැරදි.

553. (1) අන්තිම කැමති පත්‍රයක් පවතින බව ඔනෑකමින්ම වසන් කරන හෝ 516 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම දැන දැනම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, අන්තිම කැමති පත්‍රයට විෂය වන බූදලයේ වටිනාකමට සමාන දඩයකට යටත් විය යුතු ය.

(2) 524 වන වගන්තිය හෝ 528 වන වගන්තිය යටතේ වූ යම් ඉල්ලුම් පත්‍රයක දී—

(අ) මියගිය තැනැත්තාගේ යම් උරුමක්කාරයන් සිටින බව හෙළි කිරීම වුවමනාවෙන්ම පැහැර හරින; හෝ

(ආ) මියගිය තැනැත්තාගේ යම් උරුමක්කාරයකු පිළිබඳව අසත්‍ය ප්‍රකාශයක් වුවමනාවෙන් ම කරන; හෝ

(ඇ) මියගිය තැනැත්තාගේ දේපළ, ණයහිමියන් හෝ ණයකරුවන් පිළිබඳව අසත්‍ය ප්‍රකාශයක් වුවමනාවෙන්ම කරන; හෝ

(ඈ) දැන්වීමට නියමිත යම් කාරණයකට අදාළව වෙනත් යම් අසත්‍ය ප්‍රකාශයක් වුවමනාවෙන් ම කරන,

යම් තැනැත්තකු, වරදකට වරදකරු විය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, හෙළි කරනු නොලැබූ උරුමක්කාරයාට හෝ උරුමක්කාරයන්ට උරුම වන කොටසෙහි හෝ කොටස්වල වටිනාකමට හෝ අසත්‍ය ප්‍රකාශය කිරීමට විෂය වූ දේපළේ වටිනාකමට සමාන දඩයකට යටත් විය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන.

554. (1) මේ පරිච්ඡේදය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව, ශ්‍රී ලංකාවේ අන්තිම කැමති පත්‍රයක් නොතබා යම් තැනැත්තකු මියගොස් ඇති වූ ද එම තැනැත්තාගේ බූදලය සම්බන්ධයෙන් තෙස්තමේන්තු නඩු කටයුතු ආරම්භ වී නොමැති වූ ද අවස්ථාවක, එම බූදලය අද්මිනිස්ත්‍රාසි කිරීම සම්බන්ධයෙන් මේ පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) වටිනාකම රුපියල් පන් ලක්ෂයකට වැඩි බූදලයක් සම්බන්ධයෙන්, අන්තිම කැමති පත්‍රයක ප්‍රොබේට් බලපත්‍රය නිකුත් කිරීම සඳහා හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ප්‍රදානය සඳහා වූ ඉල්ලුම් පත්‍රයක්, මේ පරිච්ඡේදය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව යම් දිසා අධිකරණයට ඉදිරිපත් කරනු ලැබ, ඒ සම්බන්ධයෙන් නයිසයි ආඥාවක් කර නොමැති අවස්ථාවක, එම ඉල්ලුම් පත්‍රය, අවස්ථාවෝචිත පරිදි 524 වන වගන්තිය හෝ 528 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එය මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව විභාග කර සුදුස්සක් කරනු ලැබිය යුතු ය.

(3) වටිනාකම රුපියල් පන් ලක්ෂයකට අඩු බූදලයක් සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ප්‍රදානය සඳහා වූ ඉල්ලුම් පත්‍රයක්, මේ පරිච්ඡේදය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව යම් දිසා අධිකරණයකට ඉදිරිපත් කරනු ලැබ, ඒ සම්බන්ධයෙන් නයිසයි ආඥාවක් කර නොමැති අවස්ථාවක, එම පනත ක්‍රියාත්මක වූ දින සිට එම ඉල්ලුම් පත්‍රය පිළිබඳ ඉදිරි පියවර ගැනීම නතර කළ යුතු ය :

එසේ වුවද, අවස්ථාවෝචිත පරිදි, එම බූදලය සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර හෝ උරුමක්කාරභාවය පිළිබඳ සහතිකයක් එම මියගිය තැනැත්තාගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කරවා ගැනීමට සම්බන්ධතාවක් දක්වන යම් තැනැත්තකුට හෝ එම බූදලය සම්බන්ධයෙන් උරුමක්කාර භාවය පිළිබඳ සහතිකයක් ලබා ගැනීමට එම මියගිය තැනැත්තාගේ යම් උරුමක්කාරයකු සම්බන්ධතාවයක් දක්වන අවස්ථාවක එසේ ප්‍රදානය කිරීම අවශ්‍ය හෝ පහසු බව අධිකරණයට පෙනී යන්නේ නම්, අධිකරණය විසින්, අධිකරණයේ අභිමතය පරිදි එම නඩු කටයුත්ත ද දිගටම ගෙන යාමට අවසර දිය හැකි ය.

අර්ථ නිරූපණය.

554අ. (1) මේ පරිච්ඡේදයෙහි "ප්‍රොබේට් නිලධරයා" යන්නෙන්, දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් වරයා අදහස් වන අතර, තෙස්තමේන්තු නඩු කටයුතුවල දී ප්‍රොබේට් නිලධරයකුගේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සහ කාර්ය ඉටු කිරීම සඳහා සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද වෙනත් යම් නිලධරයෙක් ඊට ඇතුළත් වේ.

(2) මේ පරිච්ඡේදය යටතේ වූ නඩු කටයුතුවල කාර්යය සඳහා, යම් මියගිය තැනැත්තකුගේ "මුදලයට" සහ "දේපළවලට" පහත සඳහන් දේ ඇතුළත් නොවන ලෙස සැළකිය යුතු ය:—

(අ) ඒ මියගිය තැනැත්තා මියයන වේලාවේ දී යම් බැංකුවක ඔහුගේ බැරට තිබූ යම් මුදල් හෝ වෙනත් චංචල දේපළ සම්බන්ධයෙන් 544 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ නාම යෝජනයක් කර ඇත්නම්, ඒ මුදල් හෝ චංචල දේපළ ;

(ආ) යම් ආයතනයක් විසින් නිකුත් කරන ලදුව ඒ මියගිය තැනැත්තාගේ මරණය සිදුවූ වේලාවේ දී ඔහුගේ නමින් පවතින යම් කොටස් සහතිකවලින් හා තැන්පතු සහතිකවලින් නියෝජනය වන මුදල් සම්බන්ධයෙන් 544 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නාම යෝජනයක් කර ඇත්නම් එම මුදල් ; සහ

(ඇ) මියගිය තැනැත්තා විසින් එළඹෙන ලදුව් ඔහුගේ මරණය සිදුවන දිනයේ දී පවතින රක්ෂණ ගිවිසුමක් යටතේ ගෙවිය යුතු වන මුදල් සම්බන්ධයෙන් 544 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ යම් නාම යෝජනයක් කර තිබුණ ද නැත ද එම මුදල්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 554ප වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 554ප. වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (අ) ඡේදයේ "538 වන වගන්තියෙන් නියම කර ඇති පරිදි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "539 වන වගන්තියෙන් නියම කර ඇති පරිදි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (ආ) ඡේදයේ "553 වන වගන්තියෙන් නියමිත පරිදි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "551 වන වගන්තියෙන් නියමිත පරිදි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 724අ වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 724අ වගන්තියේ (1) වන උපවගන්තියේ "553 වන වගන්තියෙහි නියමිත පරිදි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "551 වන වගන්තියෙන් නියමිත පරිදි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයෙන් අංක 81, 82, 83, 84, 84අ, 84ආ, 85, 86, 87, 88, 89, 90, 91, 92 සහ 93 දරන ආකෘති අස් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ආකෘති ආදේශ කිරීමෙන්, ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"අංක 81

(516 වන වගන්තිය)

අන්තිම කැමති පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු දිවුරුම් පත්‍රයෙහි ආකෘතිය

(විධිමත් කොටස් අංක 75 මෙනි)

1. ............ හි පදිංචිව සිට 19......... මස ......... වන දින මියගිය ඒ. බී. මම දැන සිටියෙමි. හොඳින් හැඳින ගෙනද සිටියෙමි.

2. 19......... මස......... වන දින දරන ඔහුගේ අන්තිම කැමති පත්‍රය එකී ඒ. බී. යථා පරිදි ලියා අත්සන් කළේය.

3. එකී ඒ. බී. ඔහුගේ එකී අන්තිම කැමති පත්‍රය මගේ භාරකාරත්වයෙහි තැන්පත් කළේය. (නැතහොත් ඒ ප්‍රකාශක අන්තිම කැමති පත්‍රය සොයා ගත්තේ නම්, ඒ සොයා ගැනීමට හේතුවූ අවස්ථාගත කරුණු සඳහන් කරන්න.)

4. මේ සමග අමුණා ඇති උපලේඛනයෙහි දැක්වෙන ස්වභාවයෙන් සහ වටිනාකමින් සමන්විත දේපළ එකී අන්තිම කැමති පත්‍රකරු විසින් මේ අධිකරණයෙහි (හෝ අවස්ථෝචිත පරිදි වෙනත් යම් අධිකරණයක) අධිකරණ බලසීමාව ඇතුළත තබා මිය ගියේය. (නැතහොත් ශ්‍රී ලංකාවෙහි කිසිම දේපළක් නොතබා මිය ගියේය)

5. එකී අන්තිම කැමති පත්‍රය මම ඉදිරිපත් කරමි.

(විධිමත් අවසානය)

(උපලේඛනය)

(517/524 වන වගන්ති)

අංක 82

අන්තිම කැමති පත්‍රය අමුණන ලද ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය සඳහා ඉල්ලීමේ ආකෘතිය.

මියගිය ඒ. බී. ගේ අන්තිම කැමති පත්‍රයේ කාරණය සම්බන්ධයෙන්.

............පදිංචි සී. ඩී. පෙත්සම්කරු

එදිරිව

(ඉල්ලීමට විරුද්ධ විය හැකි වූ හෝ විරුද්ධ වීමට නිසි බලය ඇති යම් පැනැත්තකු වගඋත්තරකරු ලෙස නම් කරන්න.)

(විධිමත් කොටස් අංක 65 මෙනි)

1. ......... හි පදිංචිව සිටි ඒ. බී. 19......... මස ......... වන දින මිය ගියේය.

2. එකී ඒ. බී. අවස්ථෝචිත පරිදි (දැනට මේ අධිකරණයෙහි තැන්පත් කොට ඇත්තා වූ හෝ මේ සමග අමුණන ලද (524 වන වගන්තිය බලන්න) එකී අන්තිම කැමති පත්‍රය) 19......... මස......... වන දින දරන ඔහුගේ අන්තිම කැමති පත්‍රය යථා පරිදි ලියා අත්සන් කළේය.

3. පෙත්සම්කරුගේ උපරිම දැනීම අනුව මිය ගිය එකී ඒ. බී. ගේ උරුමක්කාරයන් වනුයේ :

4. මියගිය තැනැත්තා තබා ගිය දේපළ පිළිබඳ පෙත්සම්කරුට නිශ්චිතව දැනගත හැකි තාක් සම්පූර්ණ හා සත්‍ය විස්තර මීට අමුණා ඇති උපලේඛනයෙහි ඇතුළත් කොට තිබේ.

5. පෙත්සම්කරු (අවස්ථාවෝචිත පරිදි පොල්මෑකරු ණයහිමියා ආදීන්) වශයෙන් හිමිකම් පායි.

එකී අන්තිම කැමති පත්‍රය ඔප්පු කළේ යැයි ප්‍රකාශ කරන්නා වූ ආඥාවක් කරන ලෙස ද, එකී අන්තිම කැමති පත්‍රයෙහි පොල්මෑකරු නාමා යයි ප්‍රකාශ කරන ලෙසද ඒ අනුව එකී ප්‍රොබේට් බලපත්‍රය තමන්ට නිකුත් කරන ලෙසද (නැතහොත් අන්තිම කැමති පත්‍රයෙහි පිටපතක් අමුණන ලද අද්මිනිස්ත්‍රාසි බල ප්‍රදානයක් ඉල්ලුම් කරන්නේ නම් මිය, නිකුත් කරන ලෙස) පෙත්සම්කරු යටහත් භාවයෙන් ආයාචනය කරයි. (සීමිත ප්‍රදානයක් ඉල්ලුම් කරන්නේ නම් ඊට සුදුසු ආකාරයක් දක්වන්න.)

(විධිමත් අවසානය)

උපලේඛනය

(2 වන සහ 5 වන ඡේද දිවුරුම් පත්‍රයකින් හෝ වාචික සාක්ෂි මගින් සනාථ කරන්න. වලංගුත්නරකරුවකු නම් නොකරන ලද අවස්ථාවක, විරුද්ධත්වයක් ඇති වේ යයි සැක නොකරන බවට හේතු සඳහන් කර දිවුරුම් පත්‍රයකින් සනාථ කරන්න. අන්තිම කැමති පත්‍රකරු ශ්‍රී ලංකාවෙන් පිටත දී මිය ගියේ නම්, අනන්‍ය තෙස්තමේන්තු අධිකරණ බලය ඇරිමට අධිකරණය පත් කරනු ලැබීමේ ආඥාවක් ඉල්ලුම්කරු විසින් ලබා ගන්නා ලද බව ප්‍රකාශ කරන්න.)

(526/528 වන වගන්ති)

අංක 83

**අන්තිම කැමති පත්‍රයක් නොමැති අවස්ථාවක අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය සඳහා හෝ උරුමක්කාරභාවය පිළිබඳ සහතික පත්‍ර සඳහා හෝ ඉල්ලීමේ ආකෘතිය.**

(විධිමත් කොටස්)

(අන්තිම කැමති පත්‍රය සොයාගත නොහැකි බවට හෝ අන්තිම කැමති පත්‍රයක් නොමැති බවට ප්‍රකාශයක් 2 වන ඡේදය වෙනුවට ආදේශ කොට ඉහතින් සඳහන් ආකෘතිය මෙන් ඉතිරි කොටස යොදන්න)

එබැවින් පෙත්සම්කරු ඒ (ණය හිමියා වශයෙන් හෝ අවස්ථාවෝචිත පරිදි) අන්තිම කැමති පත්‍රයක් නොතබා මියගිය එකී තැනැත්තාගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසි බලය ලැබීමට හිමිකම් ඇති බව ප්‍රකාශ කරන්නා වූ ද ඒ අනුව එකී බූදලයේ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ උරුමක්කාරභාවය පිළිබඳ සහතික පත්‍රය අනුව ප්‍රදානය කළ යුතු යයි නියම කරන්නා වූ ද ආඥාවක් යටහත් භාවයෙන් අයැද සිටී.

(සීමිත ප්‍රදානයක් ඉල්ලුම්කරන්නේ නම් ඊට සුදුසු ආකාරයෙන් දක්වන්න.)

(විධිමත් අවසානය)

අංක 84

(529 (3) වන වගන්තිය)

**ප්‍රොබේට් නිලධරයා විසින් පළ කළ යුතු දැන්වීමේ ආකෘතිය**

සිවිල් නඩු විධාන සංග්‍රහයේ........., වන වගන්තිය යටතේ දැන්වීම.

මෙහි උපලේඛනයෙහි විස්තර කොට ඇති මියගිය තැනැත්තාගේ බූදලය සම්බන්ධයෙන් අන්තිම කැමති පත්‍රය ඔප්පු කිරීම/ප්‍රොබේට් බලපත්‍රය/අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය, උරුමක්කාරභාවය පිළිබඳ සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා පහත දැක්වෙන ඉල්ලීම ඉදිරිපත් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අන්තිම කැමති පත්‍රයක් ඔප්පු කරනු ලැබූ බව හෝ ප්‍රොබේට් බලපත්‍රය හෝ අමුණන ලද අන්තිම කැමති පත්‍රයක් ඇතිව හෝ නොමැතිව අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ප්‍රදානය කිරීම හෝ මෙහි උපලේඛනයේ V වන තීරයේ සඳහන් තැනැත්තන්ට උරුමක්කාරභාවය පිළිබඳ සහතික පත්‍ර නිකුත් කිරීම ප්‍රකාශ කෙරෙන ආඥාවක් කිරීමට විරුද්ධතා ඇති යම් තැනැත්තකුට 19...... මස ...... වන දින හෝ ඊට පෙර (දිවුරුම් පත්‍රයකින් සනාථ කරනු ලැබූ) ලියවිල්ලකින් ඒ විරුද්ධතාව ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබේ.

උපලේඛනය

| I වන තීරය | IIවන තීරය | III වන තීරය | IV වන තීරය | V වන තීරය | VI වන තීරය |
|---|---|---|---|---|---|
| දිසා අධිකරණයේ ලියාපදිංචි කිරීමේ අංකය | මියගිය තැනැත්තාගේ නම | මියගිය තැනැත්තා අන්තිම කැමති පත්‍රයක් තබා මියගියේ ද යනවග | ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ලිපින | ප්‍රතිලාභින්ගේ සහ උරුමකරුවන්ගේ නම් සහ මියගිය තැනැත්තාට ඇති ඥාතිත්වය | කැමැත්ත දෙන උරුමක්කාරයෝ |
| | | | | | |

ප්‍රොබේට් නිලධරයාගේ අත්සන.

දිනය. ............ ............දිසා අධිකරණයේ දිය.

අංක 85

(531 වන වගන්තිය)

**අන්තිම කැමති පත්‍රය ඔප්පු කරනු ලැබූ බව ප්‍රකාශ කෙරෙන ආඥාවෙහි ආකෘතිය**

.........පැමිණ සිටියදී ......... වන දින......... මා ඉදිරිපිට මේ කාරණය අවසාන තීරණය සඳහා ඉදිරිපත් වූ බැවින් ( ......... ගේ දිවුරුම් පත්‍රය කියවනු ලැබීමෙන්.........ගේ සාක්ෂි ලබා ගැනීමෙන්) හා (සියලු පාර්ශ්වකරුවන්ට සවන් දීමෙන් ද පසු):

(19......... මස......... වන දින කරන ලද මේ අධිකරණයේ ආඥාව අනුව .................ගේ අන්තිම කැමති පත්‍රයෙහි ප්‍රොබේට් බලපත්‍රය ................. ට නිකුත් කළ යුතු බවට ද) හෝ අවස්ථාවට සුදුසු පරිදි) මෙයින් ආඥා කරනු ලැබේ.

(තවද (වගඋත්තරකරු) වන ......... ඒ සම්බන්ධයෙන් තම අයිතිවාසිකම තහවුරු කළ බව මේ අධිකරණයට පෙනී යන හෙයින්, (අවස්ථාවෝචිත පරිදි ප්‍රොබේට් බලපත්‍රය, අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය, උරුමක්කාරභාවය පිළිබඳ සහතික පත්‍රය) ඒ අනුව එකී ......... ට නිකුත් කළ යුතු බවට තවදුරටත් ආඥා කරනු ලැබේ.)

(අත්සන් කළේ)

(ප්‍රදානය සීමා කළ යුතු අවස්ථාවක ඒ බව සඳහන් කොට, කෙතරම් වූ සීමා කිරීමක් ද යන්න සඳහන් කරන්න.)

අංක 86

(531/534 වන වගන්තිය)

**ප්‍රොබේට් බලපත්‍රයෙහි ආකෘතිය**

(ශීර්ෂය)

.......... ......... දිසා අධිකරණයේ දී ය.

මියගිය..............................ගේ මේ සමග පිටපතක් අමුණා ඇති අන්තිම කැමති පත්‍රය හා තෙස්තමේන්තුව 19........... මස........... වන දින මේ අධිකරණයට ඉදිරිපත් කොට කියවා ඔප්පු කළ බව ද, මියගිය තැනැත්තාගේ සියලු දේපළ හා මුදලය ද අයිතිවාසිකම් හා අය විය යුතු ණය ද අද්මිනිස්ත්‍රාසි කිරීම එකී අන්තිම කැමති පත්‍රයෙහි හා තෙස්තමේන්තුවෙයි නම් කරන ලද පොල්මාකරු වූ (නම හා තිල නාමය) ට භාර කළ බව ද මෙයින් භාර කරන බව ද, දේපළවල ප්‍රමාණයට හා නීතියෙන් බැඳෙන ප්‍රමාණය අනුව ද මියගිය අන්තිම කැමති පත්‍රකරුගේ ණය හා තෙස්තමේන්තු දායාද ගෙවීමෙන් එකී අන්තිම කැමති පත්‍රය ක්‍රියාවේ යෙදවීමට ද එකී දේපළවල සත්‍ය වූ සම්පූර්ණ දේපළ ලැයිස්තුවක් 19...... මස......වන දින හෝ ඊට පෙර මේ අධිකරණයේ ඉදිරිපත් කිරීමට ද 19........ මස......... වන දින හෝ ඊට පෙර ............................ගේ පොල්මංකාරත්වය සම්බන්ධයෙන් සත්‍ය වූත් සාධාරණවූත් සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කිරීමට ද, එකී ............................ විසින් පළමුවෙන් අවංක ලෙස දිවුරුම් දුන් බව ද (නැතහොත් ප්‍රතිඥා දුන් බව ද) සියලු දෙනා විසින් දැනගත යුතු ය.

19 ...... මස ...... වන දින මගේ අත්සන හා අධිකරණයෙහි මුද්‍රාව යටතේ දෙන ලදී.

.....................

අත්සන කලේ/දිසා විනිශ්චයකාර

(ප්‍රොබේට් බලපත්‍රය සීමිත වන අවස්ථාවක සීමාවේ ප්‍රමාණය සඳහන් කරන්න.)

අංක 87

(531/534 වන වගන්ති)

(අන්තිම කැමති පත්‍රය අමුණනු ලැබූ සහ අමුණනු නොලැබූ) අද්මිනිස්ත්‍රාසි බල

**පත්‍රයෙහි ආකෘතිය.**

....................දිසා අධිකරණයේ දී.

(වැන්දඹු ස්ත්‍රිය, වැන්දඹු පුරුෂයා, ළඟම නෑයා, අධිකරණයේ ලේකම්, ණය හිමියා ආදීන්, අවස්ථාවෝචිත පරිදි යොදන්න) වෙත ය:

මියගිය තැනැත්තා වන ......... ...... හි .............. විසින් (මේ සමග පිටපතක් අමුණා ඇති අන්තිම කැමති පත්‍රය මේ අධිකරණයේදී යථා පරිදි ඔප්පු කරනු ලැබූ හෙයින් සහ ඒ අන්තිම කැමති පත්‍රයෙහි පොල්මංකරුවකු නම කරනු නොලැබ අන්තිම කැමති පත්‍රයක් තිබිය දී හෝ අන්තිම කැමති පත්‍රයක් නොතබා) මැනක දී ජීවිතක්ෂයට පත් වූ හෙයින් ;

දේපළ හා මුදලය යහපත් ලෙසත්, අවංක ලෙසත් අද්මිනිස්ත්‍රාසි කිරීම සඳහා ද 19........... මස........... වන දින හෝ ඊට පෙර එකී දේපළ හා මුදලයේ ද අයිතිවාසිකම්වල ද අයවිය යුතු ණයවල ද සත්‍ය වූ සහ සම්පූර්ණ දේපළ ලැයිස්තුවක් මේ අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා ද දැනටමත් දිවුරුම් දී ඇති (නැත හොත් ප්‍රතිඥා දී ඇති) ඔබට එකී මියගිය තැනැත්තාගේ දේපළ හා මුදලය ද, අයිතිවාසිකම් හා ණය ද අද්මිනිස්ත්‍රාසි කිරීමට ද අවංකව ඒ සම්බන්ධයෙන් පුදුස්සක් කිරීමට ද .................... ගේ මුදලයට අයත් කවර හෝ ණයක් වේ නම් එය ඉල්ලා සිටීමට හා අයකර ගැනීමට ද, එකී මියගිය තැනැත්තා විසින් ගෙවිය යුතු කවර හෝ ණයක් වේ නම් එය (හා එකී අන්තිම කැමති පත්‍රයෙහි සඳහන් කරනු ලැබූ තෙස්තමේන්තු දායාද ද) එකී දේපළවල හා මුදලයෙහි ද අයිතිවාසිකම්වල හා අයවිය යුතු ණයවල ද අවකාශ ප්‍රමාණය අනුව ගෙවීමට ද ඔබට

පනත

මෙයින් සම්පූර්ණයෙන් බලය දෙනු ලැබේ. එම නිසා එකී මියගිය තැනැත්තාගේ සියලු දේපලවල හා මුදලයේ ද අයිතිවාසිකම්වල හා අයවිය යුතු ණයවල ද (අන්තිම කැමති පත්‍රයෙහි පිටපතක් අමුණා) අද්මිනිස්ත්‍රාසිකරුවකු වශයෙන් ඔබ මෙයින් පත් කොට සංස්ථාපනය කරනු ලැබේ. (එසේ වුව ද මුදලයට අයත් යම් නිශ්චල දේපලක්, විකිණීමට අධිකරණය විසින් ඔබට විශේෂයෙන් බලය දෙනු ලැබුවහොත් මිස, එය එසේ විකිණීම මෙයින් තහනම් කරනු ලැබේ.)

(අත්සන් කළේ. ආදිය).........

අංක 87අ

(531 වන වගන්තිය)

උරුමක්කාරභාවය පිළිබඳ සහතිකය

............දිසා අධිකරණයේ දිය.

......... පදිංචිව සිටි............ අධිකරණයේ අධිකරණ බාලසීමාව ඇතුළත දේපළ තබා මිය ගිය බව මේ අධිකරණයට ස්ථිර වශයෙන් දන්වා ඇති හෙයින් ;

2. අන්තිම කැමති පත්‍රයක් නොතබා 19...... මස...... වන දින මියගිය............ ගේ උරුමක්කාරයන් බවට ප්‍රකාශ කරනු ලැබූ පහත දැක්වෙන තැනැත්තන්ට උරුමක්කාරභාවය පිළිබඳ සහතික පත්‍ර නිකුත් කරවා ගැනීමට 19............ මස...... වන දින දරන පෙත්සමෙන්......................විසින් ඉල්ලීමක් කරන ලදී.

1.........පදිංචි.........(මියගිය තැනැත්තාට ඇති ඥාති සම්බන්ධතාව සහ එකඟ වූයේ නම් පංගුව)

2.........පදිංචි.........(මියගිය තැනැත්තාට ඇති ඥාති සම්බන්ධතාව සහ එකඟ වූයේ නම් පංගුව)

3.........පදිංචි.........(මියගිය තැනැත්තාට ඇති ඥාති සම්බන්ධතාව සහ එකඟ වූයේ නම් පංගුව)

3. 19......... මස ............ වන දින සහ 19............ මස............ වන දින (ප්‍රවෘත්ති පත්‍රයේ නම) පළ කරන ලද දැන්වීම මගින් ඉහත සඳහන් උරුමක්කාරයන්ට උරුමක්කාරභාවය පිළිබඳ සහතික පත්‍ර නිකුත් කිරීමට විරෝධතා කැඳවන ලදී.

4. ඉහත සඳහන් උරුමක්කාරයන්ට සහතික පත්‍ර නිකුත් කිරීමට විරුද්ධව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොකරන ලදී.

5. එම නිසා දැන් 531 වන වගන්තිය ප්‍රකාර ඔබට උරුමක්කාරභාවය පිළිබඳ මේ සහතික පත්‍රය ප්‍රදානය කරනු ලැබේ.

............,

(අත්සන කළේ/දිසා විනිශ්චයකාර)

අංක 88

(539(1) වන වගන්තිය)

ඉහතින් වූ ආකෘතිවල සඳහන් පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු විසින් දිය යුතු දිවුරුමේශි ආකෘතිය

දැන් ඔබට ඉදිරිපත් කරන ලද ............ වන දින හා ............ සලකුණ දරන ලියවිල්ල මියගිය තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රය හා තෙස්තමේන්තුව යයි ඔබ විශ්වාස කරන බව ද, (එහි ඔබ නම් කොට තිබේ නම්, එසේ නම් කරන ලද පොල්මෑකරු ඔබ බව ද) දේපලවල ප්‍රමාණය හා නීතියෙන් බැඳෙන ප්‍රමාණය අනුව මියගිය තැනැත්තාගේ ණය (හා තෙස්තමේන්තු ආයාද) ගෙවීමෙන් ද .........මුදල

ගට ගිම් විය යුතු කවර හෝ ණය ඉල්ලීමෙන් හා අයකර ගැනීමෙන් ද එකී අන්තිම කැමති පත්‍රය ඔබ අවංක ලෙස ක්‍රියාවේ යොදන බවද (නැතහොත් මියගිය.......... ගේ දේපළ හා මුදලය ද අයිතිවාසිකම් හා අයවිය යුතු ණය ද ඔබ අද්මිනිස්ත්‍රාසි කොට අවංකව සුදුස්සක් කරන බව) මියගිය තැනැත්තාගේ සියලු වංචල හා නිශ්චල දේපළ ද සියලු අයිතිවාසිකම් හා අයවිය යුතු ණයද සම්බන්ධයෙන් සත්‍ය වූ හා සම්පූර්ණ වූ ද නිවැරදි වූ ද දේපළ ලැයිස්තුවක් 19...... මස...... වන දින හෝ ඊට පෙර ඔබ විසින් මේ අධිකරණයට ඉදිරිපත් කරන බව ද 19...... මස ...... වන දින හෝ ඊට පෙර ඔබගේ පොල්මෑකාරත්වය (හෝ අද්මිනිස්ත්‍රාසිකාරත්වය පිළිබඳ) සත්‍ය වූ විස්තරයක් ඉදිරිපත් කරන බව ද ඔබ දිවුරා කියන්නෙහි ය. (නැතහොත් ප්‍රතිඥා කිරීමේ ආකෘතිය)

අංක 89

(525 වන වගන්තිය)

මියගිය තැනැත්තා අන්තිම කැමති පත්‍රයක් නොමැතිව මියගිය අවස්ථාවක ඉදිරිපත් කරන දිවුරුම් පත්‍රයේ ආකෘතිය

(විධිමත් කොටස් අංක 75 ආකෘතියේ මෙනි.)

1............පදිංචිව සිට මියගිය...........ගේ (මැත්දමුව, ලඟම ඥාතියා ආදී වශයෙන්) වන මම ඔහුගේ ජීවිත කාලය තුළ එකී.........දැන සිටියෙමි. තවද ඔහු හොඳින් හැඳිනගෙන සිටියෙමි.

2. එකී.........අන්තිම කැමති පත්‍රයක් නොතබා මෙයට අමුණා ඇති උපලේඛනයෙහි දක්වනු ලබන ස්වභාවයෙන් හා වටිනාකමින් යුත් දේපළ........... අධිකරණයෙහි. අධිකරණ බල සීමාව තුළ තබා, 19.. ...මස.. ...වන දින.........දී මිය ගියේ ය.

(විධිමත් අවසානය.)

අංක 90

(520 වන වගන්තිය)

නියම කරනු ලැබූ අවස්ථාවක පොල්මෑකරුවකු විසින් හෝ අද්මිනිස්ත්‍රාසි කරුවකු විසින් දිය යුතු බැඳුම්කරයේ ආකෘතිය

......................... දිසා අධිකරණයේ දී ය.

(පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු) සහ (ඇපකරුවන් වූ) .............. හා .............. වන අප දිසා අධිකරණයේ ලේකම් වූ .............. වෙත (........... හි තත් කාලයේ ලේකම් වෙත, එකී (ලේකම්ට හෝ තත් කාලයෙහි ලේකම්ව සිටිය තැනැත්තාට) එකී ...... රුපියල් ...... ද එකී ...... සහ එකී...... රු ...... ද ගෙවීමට ස්ථිර ලෙස බැඳී සිටින අතර, එකී ගෙවීම මනා ලෙසත් සත්‍ය ලෙසත් කරන බවට අප සියලු දෙනා ද අප එකිනෙකා ද විසින් මෙයින්......... අත්හරිමින් අප ද අපගේ උරුමක්කාරයන් ද, පොල්මෑකරුවන් ද, අද්මිනිස්ත්‍රාසි කරුවන් ද මෙයින් ස්ථිර ලෙස බැඳීමට යටත් , වන බව සියළු දෙනාම මෙයින් දැනගත යුතු ය.

(මියගිය ...................... ගේ අන්තිම කැමති පත්‍රයේ ප්‍රොබේට් බල පත්‍රය හෝ ඔහුගේ දේපළවල හා මුදලයේ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය) යථා පරිදි (ක්‍රියාවේ යෙදවීමේ හෝ අද්මිනිස්ත්‍රාසිකිරීම) සඳහා ඇප දීමෙන් පසු එකී (පොල්මෑකරුට හෝ අද්මිනිස්ත්‍රාසිකරුට) ප්‍රදානය කරන ලෙස, 19......මස......... වන දින එකී අධිකරණයේ ආඥාවෙන් නියම කළ හෙයින් :

තවද. එකී මිය ගිය තැනැත්තාගේ මුදලය රුපියල්........ ක් වූ මුදලකට තක්සේරු කර හා අගය කර ඇති හෙයින් ;

පනත

මේ ඇපකරුගේ කොන්දේසිය වනුයේ ඉහතින් බැඳුණු (පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු) එකී..............ගේ නැතහොත් ඔහු වෙනුවෙන් වෙනත් තැනැත්තකුගේ සන්තකයට හෝ දැනගැනීමට ලැබුණු හෝ ලැබෙන්නා වූ එකී මියගිය තැනැත්තාගේ සියලු දේපළ හා මුදලය පිළිබඳවද අයිතිවාසිකම් හා ණය පිළිබඳ සත්‍යය වූ සහ සම්පූර්ණ වූ දේපළ ලැයිස්තුවක් මේ අධිකරණයට 19...මස... වන දින හෝ ඊට පෙර ඉදිරිපත් කොට, එය මනා ලෙසද, සත්‍ය ලෙසද අද්මිනිස්ත්‍රාසි කළ යුතු බවය.

එනම්, එකී මියගිය තැනැත්තා මියයන අවස්ථාව වන විට ගෙවිය යුතුව තිබූ සියලු හා වෙන් වෙන් ණය සාධාරණ සහ යුක්ති සහගත ලෙසද සමානුපාතිකවද ගෙවිය යුතු බවය. සියලු ණය සම්පූර්ණයෙන්ම ගෙවීමට මුදලය ප්‍රමාණවත් නොවන්නේ නම් (එකී අද්මිනිස්ත්‍රාසි බලපත්‍රයට අමුණනු ලැබූ එකී අන්තිම කැමති පත්‍රයෙහි සඳහන් කරන ලද ඇස්තමේන්තු ආයාදද) එකී දේපළවල ප්‍රමාණයට හා නීතියෙහි නියම වන පරිදි ගෙවිය යුතු ය. තවද, 19...........මස...........වන දින හෝ ඊට පෙර තම අද්මිනිස්ත්‍රාසියෙහි සත්‍යවූත් යුක්තියසහගත වූත් විස්තරය මේ අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය. තවද එකී අද්මිනිස්ත්‍රාසියෙහි ඉතිරිව ඇති එකී දේපළවල හා මුදලයෙහි ද අයිතිවාසිකම්වලද, ණයවලද ශේෂය එයට නීත්‍යානුකූලව හිමිකම ඇති තැනැත්තාට හෝ තැනැත්තන්ට භාරදී ගෙවිය යුතුය; එවිට මේ බැඳුම්කරය අවලංගුව බලරහිත විය යුතු අතර, එසේ නොකරනු ලැබුවහොත් එය සම්පූර්ණ බලසහිතව පැවතිය යුතු ය.

(දිනය යොදා සියලු බන්ධනලාභීන් විසින් අත්සන් කරන ලදී.)

අංක 91

(543 වන වගන්තිය)

දේපළ එක්රැස් කිරීමේ බලපත්‍ර ආකෘතිය

...........දිසා අධිකරණයේ දී ය.

...........සහ........... වෙත ය.

...........පදිංචිව සිටි...........(අධිකරණ බලසීමාව) ඇතුළත දේපළ තබා මියගිය බව මේ අධිකරණයට ස්ථිර වශයෙන් දන්වා ඇති හෙයින් එකී සියලු හා සෑම දේපළ සහ ඒවායේ බදු මුදල්, ඵලප්‍රයෝජන හා ලාභ මුදල් ගැනීමට, එකතු කිරීමට, ඉල්ලීමට හා අයකිරීමටද ඒවාට හිමිකම ඇතැයි පෙනී යන තැනැත්තකුට හෝ තැනැත්තන්ට නීතියෙහි නියමිත ආකෘතිය අනුව එකී අද්මිනිස්ත්‍රාසිය භාර දෙනු ලබන තුරු හෝ ඒ සම්බන්ධයෙන් මේ අධිකරණයෙන් තවදුරටත් ආඥා ලැබෙන තුරු හෝ එය ආරක්ෂා සහිතව තබා ගැනීමටද ඔබට හා ඔබ අතුරින් එක් එක් තැනැත්තකුට මෙයින් බලය පවරා බලය දෙනු ලැබේ.

අධිකරණයේ ආඥාව පරිදි
ලේකම්. ......

19........... මස ........... වන දින දී ය.

අංක 92

(539 (1) වන වගන්තිය)

දේපළ ලැයිස්තුව හා තක්සේරුව සත්‍යක්ෂණය කිරීමේ ආකෘතිය

මියගිය..... ......ගේ අන්තිම කැමති පත්‍රයෙහි පොල්මෑකරු වූ (නැතහොත් මුදලයෙහි අද්මිනිස්ත්‍රාසිකරු ආදී නම් එසේ වූ)...........පදිංචි ඒ. බී. වන මම ප්‍රකාශ කරමි. (නැතහොත් ගෞරව බහුමානයෙන්ද, අවංක ලෙසද සත්‍ය ලෙසද ප්‍රතිඥා දී ප්‍රකාශ කරමි.)

1. නිසි උද්‍යෝගය ඇතිව මට නිශ්චය වශයෙන් දැනගැනීමට හැකි වූ ප්‍රමාණයට මියගිය එකී...........ගේ සියලුම චංචල හා නිශ්චල දේපළ අයිතිවාසිකම් හා අයවිය යුතු ණය සම්බන්ධ මගේ උපරිම දැනුම, මට ලැබුණු තොරතුරු හා මගේ උපරිම විශ්වාසය අනුව, සම්පූර්ණ වූ, සත්‍ය වූ සහ නිරවද්‍ය වූ විස්තරයක් ඉහත ලියන ලද දේපළ ලැයිස්තුවෙහි ඇතුළත්ව තිබේ.

2. එකී දේපළ ලැයිස්තුවෙහි විස්තර දැක්වෙන හා සඳහන් කරන ලද සියලු දේපළවල තක්සේරුවක් හා අගැයුමක් මා විසින් සැලකිලිමත්ව කරන ලදී. එකී දේපළ ලැයිස්තුවෙහි වෙන් වෙන් විෂයයන් ඉදිරියෙහි පිළිවෙලින් වෙන් වෙන්ව සඳහන් කරන ලද මුදල් ප්‍රමාණයන් මගේ උපරිම විනිශ්චය හා විශ්වාසය අනුව පිළිවෙලින් එම විෂයයන්ගේ වර්තමාන මිල බව සම්පූර්ණ හා සාධාරණ ලෙස දක්වයි.

## අංක 93

(531 වන වගන්තිය)

### ස්ථිර තහනමෙහි ආකෘතිය

..... ............... දිසා අධිකරණයේ දී ය.

............පදිංචිව සිට 19......මස......වන දින මියගිය......... ගේ මුදලශ හා බඩු බාහිරාදිය සම්බන්ධයෙන් (සම්බන්ධතාවක් ඇති පාර්ශ්වකරුවන්ගේ ලේඛනගත නීතිඥයා වූ.......හි........මහතා නොදැනුවත්ව හෝ අවස්ථාවෝචිත පරිදි) කිසිවක් නොකරත්වා.

(පාර්ශ්වකරු විසින් අත්සන් කොට දිනය යොදන ලදී.)

8. 1988 අංක 79 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනතේ 18 වන, 20 වන, 25 වන වගන්තියේ සිට 41 වන වගන්තිය (දෙකම ඇතුළුව) දක්වා වූ වගන්ති ඉවත් කිරීමෙන් ඒ පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1988 අංක 79 දරන පනතේ 18 20 සහ 25 සිට 41 දක්වා වගන්ති ඉවත් කිරීම.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.